# බුදුගුණ භාවනාව

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති ප්‍රධාන අනුශාසක මහා කම්මට්ඨානාචාර්ය
ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය

ශාසනධජ-ශ්‍රී ජිනවංශ ඤාණාරාමවංශාවතංස

ශාසනශෝභන මහෝපාධ්‍යාය අතිපූජ්‍ය **නාඋයනේ අරියධම්මාභිධාන**
අනුනායක ස්ථවිර

පටුන

# ආශිර්වාදය 1

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්‍ය මීතිරිගල, නිස්සරණ වන අරණ්‍ය සේනාසනාධිපති, ප්‍රධාන කම්මට්ඨානාචාර්‍ය අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත, **මාතර සිරි ඤාණාරාමාභිධාන** මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේගේ ආශිර්වාදය

# බුද්ධානුස්සතිය

බුදුරජාණන් වහන්සේ යන, ගුණ සාගරයකි. සර්වඥ බුදු උතුමෙකුගේ ගුණ සමුදාය විෂය වනුයේද, එබඳු සර්වඥ බුදු නුවණකටමය. තථාගතයන් වහන්සේ මේ අනන්ත වූ බුදුගුණ පද නවයකින් කැටි කොට දෙව් - මිනිසුන්ගේ හිත - සුව පිණිස, ලොව හමුවේ තැබූ සේක.

බුද්ධානුස්සතිය බුදු කෙනෙකුගේ පහළවීමෙන්ම ලොවට ලැබෙන අගනා භාවනාවෙකි මෙය ගැඹුරු වූද, නොගැඹුරු වූද, නුවණ ඇති කාහටත් සප්පාය වෙයි. අසහනයෙන් පෙළෙන ලොවට බුද්ධානුස්සතියෙන් මහත් සැනසුමක් උදාවෙයි.

බුදුගුණයට සිත යොමු කරන පින්වතා ගේ සිත සැදැහැයෙන් පිවිතුරු වෙයි. නීවරණ සංසිඳී තැන්පත් වෙයි. එබඳු චිත්ත සන්තානය මූල කර්මස්ථානයකට යොමු කිරීමෙන් උසස් ප්‍රතිඵල ලැබෙයි. එබැවින් බුද්ධානුස්සතිය යෝගාවචරයන්ගේ, චතුරාරක්ෂක භාවනාවක් අතර ද මුල් තැනක් ගනියි.

බුදුගුණයෙන් නිරන්තර පරිභාවික චිත්ත සන්තාන ඇති අපේ නාඋයනේ අරියධම්ම ස්ථවිර නම විසින් සැකසුන මේ විස්තරාත්මක බුදුගුණ භාවනා පොත, බැලූ බැල්මට සිත පැහැදෙන, මෙතෙක් දක්නට නොලැබුණ විදියේ බුදු ගුණ සම්පිණ්ඩනයකි.

බුදුගුණයෙන් සැනසෙනු කැමති සත්පුරුෂයනට මෙය හස්තසාර වස්තුවක් බව කියනු කැමැත්තෙමි. මේ බුද්ධානුස්සති කමටහන් උපදේශ පන්තිය සේම ශාසනික උත්තමාර්ථයන් සාකල්‍යයෙන් සපුරා ගැනීමට

පටුන

උපයෝගි විය හැකි පරිදි තව තවත් උතුම් කමටහන් සැදැහැ නුවණ ඇති බෞද්ධ ජනතාව ඉදිරියෙහි තැබීමට අවස්ථාව සැලසේවායි! අපි ප්‍රර්ථනා කරමු.

බුදුගුණ බෙලෙන් සැම දෙන හට සැනසුමක්ම වේවා! මෙයට

ශාසනෝදය කාමී,

මා, ඤාණාරාම ස්ථවිර

ශ්‍රී කල්‍යාණි යෝගශ්‍රම සංස්ථාවේ අධිපති ප්‍රධාන කම්මට්ඨානාචාර්යය අග්ග මහා පණ්ඩිත අති පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහෝපාධ්‍යායන් වහන්සේ ප්‍රමුඛ නා උයන ආරණ්‍ය සේනාසනයේ මහා සංඝරත්නය වෙත මෙම ග්‍රන්ථය පුදමි.

පටුන

# ආශිර්වාදය 2

ශ්‍රී කළ්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක ප්‍රධාන අනුශාසක තැන්පත් අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත **කඩවැද්දූවේ, ශ්‍රී ජිනවංශාභිධාන** අස්මදාචාර්‍ය්‍ය මාහිමියන් වහන්සේගේ ආශිංසනය.

## බුදු පෙරහැර

ඔබ නොයෙක් විදියේ විසිතුරු පෙරහැර දැක - අසා ඇත. ඒ පෙරහැර වල නිමිති අරමුණු ද විවිධය. නොයෙක් නැටුම් ගැයුම් වලින් සාටෝප වූ ඒ පෙරහැර වලින් සිතට ඇතිවන සතුට සාමිස ය. පිංකම් නමින් කළත් ඒවායෙ පුණ්‍යමය අගය, සැළකිය යුතු තරම් නොවේ. අපේ සැදැහැබර මව්පිය දරු දැරියන් මල් පහන් ආදී පූජාවස්තු රැගෙන පෙළ සැදී බැති සිතින් බුදු පෙරහැර - බුදු පෙරහැර කියමින් පෙරහැර පවත්වනවා දක්නට ලැබේ. ඒ පෙළේ කුඩාවුන් තබා ලොකු ඇත්තන්ගෙන් වැඩි දෙනෙකුගේ බුදු පෙරහැරනම් කුමක්දැයි හරිහැටි නොදන්නවා විය හැකිය. සමහර විට ඔවුන් සිතනවා විය හැකි මෙසේ - මල් පහන්, ගිලන්පස වැනි පූජා වස්තූන්  රැගෙන සිද්ධස්ථානයක් කරා පෙළ සැදී යාම බුදු පෙරහැරය කියා. සැබවින් ම එය බුදු පෙරහැරක් නොවෙයි. එය බුද්ධ පූජා පෙරහැරකි. බුදු පෙරහැරය කියන්නේ අපරිමාණ කාලයක් මුළුල්ලෙහි, සාතච්චකාරි - සක්කච්චකාරි - අසන්තුට්ඨිතා - අප්පටිවානිතා යනුවෙන් පැහැදිලිවෙන සතර වැදෑරුම් කාර්ය සම්පත්තියෙන් සැදී මහ පොළව හඬවමින් බුදුවනතුරු නොකඩවා සිදුකොට වදාළ උතුම් වැඩ පිළිවලය. මනෝප්‍රණිධාන - වාක්ප්‍රණිධාන - මහාප්‍රණිධාන වශයෙන් පැවැත් වූ ඒ අසිරිමත් පෙරහැර බුදු ගුණ භාවනාවෙන් ඔබට ප්‍රත්‍යක්ෂ කළ හැකිය. බුදුගුණ පෙළේ අති විශේෂ මූලික ගුණය නම් අරහං බුදු ගුණය යනුයි. අරහං යන බුදු ගුණය අති විශේෂ වනුයේ බුද්ධත්වය හා සම්බන්ධ සෙසු සියලු ගුණයන්ගේ හේතුකාරක

තත්ත්වය අරහං ගුණයෙන් විහිදෙන හෙයිනි. බුදු ගමනේ මුල් පියවරේ පටන් බුදු සිත වඩමින් සිදුකොට වදාළ පාරමී ධර්ම සමෘද්ධිය අරහං

පටුන

ගුණය පරිකර්ම කිරීමේදී ඔබට පෙනීයනු ඇත්තේ අසදිස බුදු පෙරහැරක් ලෙසිනි.

බුදු පෙරහැරේ අවිඡරිය ස්වරූපය තමන් නිවී සැනසී ලොවක් නිවා සනසා ලීමයි. "බුද්ධොහං බොධයිස්සාමි" යන මහා කරුණා ප්‍රර්ථනාව අනුව සැළකීමේදී එය පැහැදිලි වන්නේය. "බුද්ධො" මම පරම සත්‍ය අවබෝධ කොට "බොධයිස්සාමි" ලෝකයාට ද, අවබෝධ කරවන්නෙමි. යන තේරුමෙන් බුදු පෙරහැරේ අත්තහිත - පරහිත - සාධන ස්වරූපය වටහා ගත හැකිය. බුදුගුණ භාවනාවේ නිසද්දඵලය හැටියට සැළකිය යුත්තේ සාමාන්‍ය ජීවිතයක් ලෝකාග්‍ර වූ බුද්ධත්වය වැනි උසස් තැනකට නංවාලමේ උත්තරීතර වැඩ පිළිවෙල හෙවත් බුදු පෙරහැර - සිතින් දැක ගැන්මයි. එය ඔබට මහා සැපයකි. මහා සැනසිල්ලකි. බුදුගුණ භාවනාවේ මහා ආනිසංශ ඵලය විය යුත්තේ ඔබත්, බුදු පෙරහැරට එක් වීමයි. බුදු පෙරහැරට එක් වූ මහා සත් පුරුෂයාගේ එම පැවතුම් මහිමය ගුරුළු ගෝමී මහා වියතාණෝ මෙසේ විසදති.

**බුදුගුණ මුත් තෙපුල් මෙත් බහාවුන් මුත් සිත්,**

**නොවේවා කෙනෙක්හි දූ පර වැඩ මුත් පියෝ මා.**

බුදු ගුණයෙන් තොර වචනයක්, මෙත් බැවුනේ තොර සිතිවිල්ලක්, පරහිතයෙන් තොර ක්‍රියාවක් කිසිම මොහොතක නොවේවා!

ඔබ සැම මේ සැනසිලි පෙරහැර විසිතුරු කෙරෙත්වා! මනෝභාවනීය ධර්ම වස්තුවක් වූ අපේ සසුන් දරු නාළයනේ අර්යධම්ම ස්ථවිර නමගේ කාරුණික අනුශාසනා පරිදි පැවැත්වෙන කොළඹ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ භාවනා සංවිධානය තව තව විසිතුරු වේවා බුදු පෙරහැරක්ම වේවා! යනු මාගේ ධර්මාශිංසනයයි. සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාණ පත්තියා.

මෙයට කාරුණික අතිපූජ්‍ය,

පණ්ඩිත කඩවැද්දූවේ ශ්‍රී ජිනවංශ ස්වාමීද්‍රයන් වහන්සේ

පටුන

# හැඳින්වීම

බුද්ධානුස්සතිය, සමථ විදර්ශනා භවනා දෙකෙන් සමථ භාවනාවකි. කසීන 10, අසුභ 10, අනුස්සති 10, අප්පමඤ්ඤා 4, සඤ්ඤා 1, වවත්ථාන 1, හා අරූප 4, යන, සමසතළිස් සමථ කමටහන් අතුරින් අනුස්සති දශයට ඇතුළත් වේ. යෝගාවචරයන් විසින් අනිවාර්යයෙන්ම භාවිතා කළ යුතු වූ සතර කමටහන් අතුරෙන් මුලින්ම තැන ගන්නේ බුද්ධානුස්සතියයි. සිහිකිරීම් අර්ථය ඇති සතිය, නැවත, නැවතත් සියවර දහස්වර ලක්‍ෂවාර කෝටි ප්‍රකෝටි වාර පැවැත්වීම අනුස්සති නම් වේ. අවශ්‍යයෙන්ම නියතයෙන් පැවැත්විය යුතු වූ සතිය, යන තේරුමෙන් ද, අනුස්සති නම් වේ. (බුද්ධො සබ්බඤ්ඤුත ඤාණෝ) සර්වඥතා ඥානය ඇත්තා වූ බුද්ධ රත්නය පිළිබඳ විද්‍යමාන වූ අප්‍රමාණ ගුණ සමුදාය නැවත නැවතත් අනුරූප වශයෙන් සිහි කරමින් පවත්වන භාවනාව බුද්ධානුස්සතිය නමින් හැඳින් වේ. සීලයක පිහිටා තෙරුවන් නැමද, පහසු වූ අසුනක තැන්පත්ව වාඩි වී, පූර්ව කෘත්‍යය විධි නිමවා ජීවමාන සර්වඥයන් වහන්සේ ඉදිරිපිට සේ බුද්ධ ගෞරවය උපදවා නව අරහාදී බුදු ගුණ අනුලෝම - මුල සිට අගටත්, ප්‍රතිලෝම-අග සිට මුලටත් පද වශයෙන් හා තේරුම් වශයෙන් බුදුගුණ භාවනාව වැඩිය යුතුය. පුරුදු වූවාට පසු අවධි වූ තැන් පටන් රාත්‍රී නින්දට යන තුරු, දවසේ සැමවිට සැම ඉරියව්වකදීම, සැම කටයුත්තකදීමත් බුදු ගුණ මෙනෙහි කරමින් සිත දියුණු කර ගැනීමේ ශක්තිය සමත්කම ඒකාන්තයෙන්ම ලැබේ. බුදු ගුණ මෙනෙහි කිරීමේදී, රාග - දෝස - මෝහයෙන් කිළිටි වූ පාප සිතිවිලි දුරින්ම දුරු වෙයි. පාප සිත්, පාප වචන, පාප ක්‍රියාවලින් ඈත් වෙමින් තමනුත් අරහං ගුණයට සමීප වේ. නව අරහාදී බුදු ගුණයට එකතු වෙන තම සිත බුදුගුණ ප්‍රීතියෙන් පිරිගනී. ගත - සිත සැහැල්ලු වෙමින් සිතටත් කයටත්, නිරාමිස සුවයක් ඇති වේ. සීත රැයක සුවදායක පොරොවනයකින් ලැබෙන සනීපයක් සේද, චතුමධුර පානයක් සේද, මුළු කය ප්‍රියෙන් සැපයෙන් ඔකඳ වෙයි. බුදුගුණ සුවයෙන් සුවපත් වූ සිත

පටුන

බුදුගුණ අරමුණෙහි සමාධි ගත වෙයි. ධ්‍යානංග පසක් වැඩෙන අතර නීවරණ පස දුරු වී ලැබෙන එම සමාධිය, උපචාර ධ්‍යාන නම් වේ.

බුදුගුණ භාවනාව වඩන්නා බුද්ධ රත්නය කෙරෙහි අප්‍රමාණ ගෞරව ඇත්තෙකු බවට පත් වේ. ශ්‍රද්ධාව - සතිය - ප්‍රඥාව හා පුණ්‍ය සම්පත්තියෙන් විපුලත්වයට පැමිණේ. ප්‍රීති ප්‍රමෝද්‍ය හා සැප සම්පත් ලබන්නෙක්ද වේ. සහනසීලි සාමකාමී කෙනෙක් හා බිය නැති වූද, කුඩා මහත් දුක් ඉවසන්නෙක්ද වේ. ශාස්තෘන් වහන්සේ සමග එක තැන ජීවත් වන හැඟීමද ඇති වේ. බුදුගුණ පිරුණු හදවතක් ඇති ඔහුගේ ශරීරයද, දාගැබක් සේ පූජා සත්කාර කිරීමට සුදුසු වේ. බුදු බවටද, සිත නැමේ. වරදක් කිරීමට සිතක් ඇති වූ කෙනෙහිම ශාස්තෘන් වහන්සේ තමා ඉදිරියේ මෙන් වැටහීමෙන් හිරි ඔතප් එළඹ සිටී. අසනීප, අපල උපද්‍රව ආදිය හිරු දුටු අඳුරු සේ ඉවත් කිරීමට බුදුගුණ බලය පිහිට වේ. මේ ජීවිතයේදී මග ඵල නිවන් පසක් කිරීමටද, බුදුගුණ භාවනාව ප්‍රත්‍ය වන අතර, මග ඵල නොලැබුනහොත් ඒකාන්තයෙන් සුගති පරායණ වන්නේය. බුදුගුණ වැඩූ පිනැතියෝ නිවන් දක්නා තුරු පිටසක්වල නොයති. අහේතුක ද්විහේතුක නොවෙති. සතර අපායට නොවැටෙති. නියත මිසදෙටු නොගනිති. අෂ්ට දුෂ්ටක්ෂණයෙන් හා පඤ්ච අන්තරායෙන් මිදෙති. කල්ප විනාශයට අසු නොවෙති. ශ්‍රද්ධා - ප්‍රඥා - ස්මති - මේදාදී ගුණයෙන් උසස්ව උපදිති. කල්‍යාණ මිත්‍රයන් ලබති. සර්වඥයන් වහන්සේලාද තමන් වෙත පැමිණ පිහිට සළසති.

භාවනා වැඩීමේ අනුසස් මනාව දන්නා වූ කොළඹ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ විශේෂාරාධනාවෙන් පටන් ගන්නා ලද බුදුගුණ භාවනා පන්තියේ අවසාන දිනයේදී බෙදා දීම පිණිස මේ පොත සකස් කරන ලදී. වර්ෂ 1984 ජූනි මස 06 වෙනි බදාදා ආරම්භ කරන ලද බුදු ගුණ භාවනාව, මසකට වරක් බැගින් ප්‍රගුණ කරන ලදුව ඒ භාවනා පාඩම් 9 නවය මෙසේ පොතක් වශයෙන් සකස් කොට බෙදා දීම, ඥාන සම්පයුත්ත ධර්ම දානයකි.

පටුන

පොහොය අටසිල් - දස සිල් සමාදන් වන උපාසකෝපාසිකාවන්ටද, මෙය පොහොය දවස ඉතාමත්ව සාර්ථකව ගත කර ගැනීමට පිහිටවන භාවනා පොතකි. සිල්සමාදන්ව බුදුගුණ භාවනා වැඩීම, බ්‍රහ්ම උපෝසථය, නමින් වදාරා ඇත. දහම්ගුණ සය සඟ ගුණ නවයටත් සවිස්තරව භාවනා පොතක් වශයෙන් නිකුත් කිරීමටද, රාජ්‍ය සේවා බෞද්ධ සංගමය ප්‍රර්ථනා කරන බැවින් බුදුගුණ බයෙන් ඒ උතුම් පැතුමද ඉටු වේවා!

බුදුගුණ භාවනාවේ වටිනාකම පහදා දෙමින් මෙය අනුමත කොට වදාළ මීතිරිගල නිස්සරණ වන අරණ්‍ය සේනසනාධිපති අතිපූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමින් වහන්සේට හා, අතිපූජනීය රාජ්කීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන අස්මදාචාර්ය මාහිමියන් වහන්සේට, බුදුගුණ බලයෙන් ශත වර්ෂාධික කාලයක් නිදුක් නිරෝගී දීර්ඝායු ශ්‍රී සම්පතත් අභිවර්ධනය වේවා! තිලොවට පිහිටවන ලෙස මතු බුදුබව ලබත්වා! යි වැඳ නමස්කාරයෙන් ප්‍රාර්ථනා කරන්නේ අසීමිත ගුරු භක්තියෙනි.

මසකට වරක් බැගින් පිළිවලින් පළ වූ බුදුගුණ පාඩම් පෙළ පොතක් වශයෙන් මුද්‍රණය කිරීමේ පහසුව පිණිස පිටපත් කර දුන් ගුණවර්ධන යෝගාශ්‍රම වාසී වැවේ ගෙදර සෝමානන්ද ආයුෂ්මතුන් වහන්සේටත් බෞද්ධ කොමසාරිස් තුමාටත්, රාජ්‍යසේවා බෞද්ධ සංගමයේ නිළධාරී මණ්ඩලය ප්‍රධාන සාමාජික පිරිසටත්,මේ බුදුගුණ භාවනා වඩන සැම සැදැහැතියනටත් නිදුක් නිරෝගී සුව දීර්ඝායු අත් වේවා! සමථ විදර්ශනා භාවනා දියුණු වේවා! සර්වඥ ශාසනය යළි නංවාලීමේ ශක්තිය ලැබේවා! සකළ සම්‍යක් ප්‍රාර්ථනා සඵල වේවා! ශාන්ති ලක්ෂණ අමෘත මහා නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් සාක් සාත් වේවා! තෙවැනි වරට බුදුගුණ භාවනා පොත මුද්‍රණය කරවා ධර්ම දානය පිරිනමන සත්ගුණවත් රුක්ලන්ත මායාදුන්න මහතාට හා කමානී විජේසුන්දර මායාදුන්න මහත්මියටත් ආයුරාරෝග්‍යාදී සම්පත් හා ශාන්ත නිර්වාණ සම්පත් අත්වේවා.

පටුන

බුදුගුණයෙන් සැනසෙන,

නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය, ගල්දූව - කහව, අම්බලන්ගොඩ.

පටුන

# අපෙන් වචනයක්

ශ්‍රී බුද්ධ වර්ෂ 2500 බුද්ධ ජයන්තිය අනුස්මරණය කිරීම සඳහා පිහිටුවා ගන්නා ලද රාජ්‍ය පාලන සේවයට සම්බන්ධ ප්‍රබල බෞද්ධ සංවිධානයක් ලෙස 1954 ඔක්තොම්බර් මස 05වන දින බිහි වූ ආයතනයක, රාජ්‍ය සේවා බෞද්ධ සංගමය, සාමාජිකයන්ට විශේෂ වශයෙනුත් පොදුවේ ජනතාවගේ යහපත සදහාත්. මෙම සංවිධානය විසින් මාසිකව භාවනා පන්තියක් ආරම්භ කිරීම, 1984 වර්ෂයේ සංගමය ඇරඹූ විශේෂ සේවාවකි. සංගමයේ විශේෂ නියොජිත පිරිසක් මේ සඳහා අම්බලන්ගොඩ ගල්දූවේ ගුණවර්ධන යෝගාශ්‍රමයට 1984 මැයි මස ගොස් එහි අධිපතිව වැඩ සිටින පූජ්‍ය කඩවැද්දුව ජිනවංශ මහා ස්වාමීන් වහන්සේට කරුණු සැළකිරීමෙන් අනතුරුව 1984 ජූනි මස සිට මෙම මාසික භාවනා පන්තිය පැවැත්වීම සදහා එම යෝගාශ්‍රමයේ වැඩ වසන පූජ්‍ය නා උයනේ අරියධම්ම මහා ස්වාමින් වහන්සේ කොළඹට වැඩම කරවා ගැනීමට අවකාශ සැළසිනි.

ඒ අනුව ප්‍රථම භාවනා පන්තිය 1984 මැයි මස 06වෙනි දින කෞතුකාගාර දේශන ශාලවේදී ආරම්භ විය. පැමිණෙන පිරිස විශාල වූයෙන් ඉන් පසුව කොළඹ මහනගර සභා මහජන පුස්තකාලයේ ශ්‍රවනාගාරයේදී අනතුරුව බම්බල පිටියේ වජිරාරාමයේදී මෙම මාසික භාවනා පන්ති පවත්වනු ලබන අතර, 1985 මාර්තු මස 13වන දින වන විට නව අරහාදී බුදුගුණ පාඨ මුල් කරගෙන විශේෂ භාවනා පන්තියක්ද යනුවෙන් භාවනා පන්ති 10ක් කම්මට්ඨානාචාර්ය පූජ්‍ය නාඋයනේ අරිය ධම්ම මහා ස්වාමීන් වහන්සේ විසින් පවත්වන ලදී. දැනට මෙම භවනා පන්ති වලින් ප්‍රයොජන ගැනීමට සැදැහැවතුන් සිය ගණනින් පැමිණීම දැක්ම සංගමයේ බලවත් ප්‍රීතියට කරුණකි.

භාවනා පන්තිය පවත්වන දිනවල දේශනා අවසානයේදී එහි සාරාංශය සටහන් වශයෙන් සැපයීම සැදැහැවතුන්ට පහසුවක් විය. ඒ

පටුන

සියල්ල කැටිකොට භාවනා උපදෙස් අත් පොතක් වශයෙන් මුද්‍රණය කිරීමට තීරණය කොට පොත සකස්කර දෙන ලද පූජ්‍ය අරියධම්ම මාහිමියන් වහන්සේට රාජ්‍ය සේවා බෞද්ධ සංගමය කළ ආරාධනය කාරුණිකව පිළිගෙන එය ඉටුකර දීම ගැන සංගමය උන්වහන්සේට ආසිරි පතයි.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මෙහෙවන කුඩු මහත් ආගමික ජාතික කටයුතු වලදී ඉතා කැමැත්තෙන් ඉදිරිපත්ව රජය වෙනුවෙන් පහසුකම් සැපයීමට ක්‍රියාකරන ගරු සංස්කෘතික අමාත්‍ය ඊ. එල්. බී හුරුල්ලේ මැති තුමාට හා සංස්කෘතික ලේකම්තුමාටද, සංගමයේ ඉල්ලීම පරිදි පොත මුද්‍රණය කර දීමට සහය වීමට ඉදිරිපත් වූ බෞද්ධ කටයුතු කොමසාරිස් තුමාට, මුද්‍රණාලාධිපතිතුමා ඇතුලු මුද්‍රණ කාර්‍යය මණ්ඩලයට, නිළධාරී හා සේවක පිරිසට සංගමයේ පුණ්‍යානු මෝදනා පූර්වක ස්තුතිය ප්‍රකාශ කරමු.

බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී මහා ගුණ සමුදාය අවබෝධ කරගැනීමට මෙම පොතේ අඩංගු භාවනා මාර්ගය හේතු වේවා! යි පතමි. මෙයට ධර්මස්ප්‍රීතිකාමී,

ආචාර්‍ය එච්. ඒ. වී. අභයවර්ධන. ගරු සභාපති,

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය

යූ. එස්. මුදලිගේ ගරු ප්‍රධාන ලේකම්, රාජ්‍ය සේවා බෞද්ධ සංගමය.

පී. එල් ජිනදාස සභාපති ආගමික අංශය සංස්කෘතිය අමා ්‍යාංශය, මැලේ වීදිය, කොළඹ 02.

පටුන

# පුණ්‍යානුමෝදනාව

**බුද්ධෝපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං**
**කප්පම්පි චේ අඤ්ඤමභාසමානෝ**
**ඛීයේථ කප්පෝ චිරදීඝමන්තරේ**
**වණ්ණෝ න ඛීයේථ තථාගතස්සා'ති.**

ලොවුතුරා බුදු කෙනෙකු ආයුෂ අවසන් වන තෙක් වෙනත් බණක් දේශනා නොකර බුදුගුණම දේශණා කරන්නේ නම් තමන් වහන්සේ ගේ ආයුෂ ගෙවී ගියද, තථාගත බුදුරජාණන් වහන්සේගේ බුදුගුණ වර්ණනාව නිම කළ නොහැක්කේමය.

අප මහා බෝසතාණන් වහන්සේ තම පාරමී ගමනේ සත් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් සිතින් බුදු බව පතමින් මනෝප්‍රනිධායද නවාසංඛ්‍ය කල්ප ලක්ෂයක් වචනයෙන් බුදුබව පතමින් වාක්ප්‍රනිධානයද, දීපංකර පාද මූලයේ පටන් සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් දස පාරමී සමතිංසත් ආකාරයෙන් සම්පූර්ණ කරමින් මහාප්‍රනිධානයද වශයෙන් ඉතා විසිතුරු ලෙස මේ පාරමී ගමන සම්පූර්ණ කිරීමට යෙදුනි.

මෙසා අති දීඝී පාරමි ගමනේ ලොව පහළ වූ (512027) පන්ලක්ෂ දොළොස් දහස් විසි එක් නමක් බුදුවරු සියසින් දැක වැඳ උපස්ථාන කරමින් තම පාරමිතා පෙළඹර විසිතුරු කරන්නට යෙදුනි.

මේ සා අති දීඝී කාලයක් අප මහා බෝසතාණෝ අනන්ත දුක් විදිමින් පැමිණියේ සංසාර සාගරයේ ගිලී සිටින මේ සත්වයා සසර සයුරෙන් එතර කිරීමටය. එසේනම් පෙරුම් දම් පුරා බුදුබවට පත්වී වදාළ ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ එම උතුම් බුදු ගුණය කවරෙක් සිතා, කියා නිමකරන්නද, සමාර්ථයෙක් ලොව නැත. අනන්තාපරිමාන බුද්ධ ගුණය ගුණ පද නවයකට කැටිකර අප නව අරහාදී බුදුගුණ ලෙස සිහිපත් කරමු. සැබවින්ම මෙම සිත සනසන, නිවාලන, සසර දුක් නැති කිරීම හේතුවන භාවනා මාර්ගයකි. ඒ වූ උතුම් බුදුගුණ අප

පටුන

සෑම දෙනාටම වටහා ගැනීමට පහසු ලෙස විස්තරාත්මකව සැකසීමට යෙදුනේ අප ගුරු දේවෝත්තම වන්දනීය අතිගරු පූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ අතිනි.

අප වෙත මෙම දහම් පොත මුද්‍රණයට අවසර ලබා දුන් විස්තරාත්මක බුදුගුණ භාවනා පොත සම්පාදනය කළ අතිගරු පූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වන්සේට මෙම ධර්ම දාන කුසල් බලයෙන්ද, මෙතෙක් කලක් ධර්ම දානය වශයෙන් දහස් සංඛ්‍යාත පිරිසක් වෙත දහම් පොත් පිරිණැමීමෙන් අප රැස්කළ සියලු කුසල් බලයෙන් නිදුක් නිරෝගී භාවය දීර්ඝායුෂ ලැබේවා!

මෙයට

මෙතැති යටියන මංගල ඉසි ස්වාමීන්වහන්සේ

පටුන

# පටුන


ආශිර්වාදය 1 .......... 2

ආශිර්වාදය 2 .......... 4

හැදින්වීම .......... 6

අපෙන් වචනයක් .......... 10

පුණ්‍යානුමෝදනාව .......... 12

01 ආජීව අෂ්ඨමක සීලය සමාදන් වීම. .......... 16

02 බුද්ධානුස්සති භාවනාව .......... 20

03 අරහං බුදු ගුණය (පාළි) .......... 24

04 අරහං බුදුගුණය තේරුම .......... 26

05 අරහං පද විවරණය .......... 31

06 සම්මා සම්බුද්ධ ගුණය (පාළි) .......... 35

07 සම්මා සම්බුද්ධ ගුණය තේරුම .......... 38

08 සම්මා සම්බුද්ධ පද විවරණය .......... 44

09 විජ්ජාචරණ සම්පන්න ගුණය (පාළි) .......... 47

10 විජ්ජාචරණ සම්පන්න ගුණය තේරුම .......... 50

11 විජ්ජාචරණ සම්පන්න පද විවරණය .......... 55

12 සුගත බුදු ගුණය (පාළි) .......... 58

13 සුගත බුදු ගුණය තේරුම .......... 60

14 සුගත පද විවරණය .......... 65

15 ලෝකවිදූ ගුණය (පාළි) .......... 68


පටුන

16 ලෝකවිදූ ගුණය තේරුම. ........................................................ 71

17 ලෝකවිදූ පද විවරණය ..........................................................76

18 අනුත්තරෝ පුරිසදම්මසාරථී ගුණය (පාළි)..........................79

19 අනුත්තරෝ පුරිස දම්ම සාරථී බුදු ගුණය තේරුම ..............82

20 අනුත්තර පුරිසදම්මසාරථී පද විවරණය............................. 88

21 සත්ථා දේවමනුස්සානං බුදුගුණය (පාළි) ........................... 91

22 සත්ථා දේවමනුස්සානං බුදුගුණය තේරුම .........................94

23 සත්ථා දේවමනුස්සානං පද විවරණය.............................. 100

24 බුද්ධෝ බුදුගුණය (පාළි).................................................... 103

25 බුද්ධෝ බුදුගුණය තේරුම .................................................. 106

26 බුද්ධ පද විවරණය ........................................................... 112

27 භගවා බුදු ගුණය (පාළි).....................................................114

28 භගවා බුදුගුණය තේරුම ....................................................116

29 භගවා පද විවරණය ..........................................................121

පටුන

# 01 ආජීව අෂ්ඨමක සීලය සමාදන් වීම.

## සිල් ඉල්ලීම :

ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං ආජීව අට්ඨමක සීලං ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ,

දුතියම්පි, අහං භන්තේ, -පෙ-

තතියම්පි, අහං භන්තේ තිසරණේන සද්ධිං ආජීව අට්ඨමක සීලං ධම්මං යාචාමි. අනුග්ගං කත්වා සීලං දේථ මේ භන්තේ අනුකම්පං උපාදාය.

**දේශක :** යමහං වදාමි තං වදේථ.

**ශ්‍රාවක :** ආම භන්තේ.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස///

බුද්ධං සරණං ගච්ඡාමි. ධම්මං සරණං ගච්ඡාමි. සංඝං සරණං ගච්ඡාමි.

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි.

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. තතියම්පි සංඝං සරණං ගච්ඡාමි.

**දේශක :** සරණාගමනං සම්පුණ්ණං

**ශ්‍රාවක :** ආම භන්තේ

## තේරුම

අවසර ස්වාමින් වහන්ස, මම තිසරණ සහිත ආජීව අෂ්ටමක සීල ධර්මය ඉල්ලා සිටිමි. ස්වාමිනි මට අනුග්‍රහ කොට සීලය ලබා දෙන සේක්වා.

පටුන

අවසර ස්වාමිනි දෙවනුවද, තෙවනුවද අනුකම්පාව උපදවා සීලය දෙන සේක්වා.

**දේශක :** මම යමක් කියන්නෙම්ද, එය කියනු මැනව

**ශ්‍රාවක :** එසේය ස්වාමින් වහන්ස,

**නමස්කාරය :**

භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම් බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම් බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම් බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

නිවන් සුව විඳීම පිණිස බුද්ධ රත්නය සරණ යමි. නිවන් සුව විඳීම පිණිස ධම්ම රත්නය සරණ යමි. නිවන් සුව විඳීම පිණිස සංඝ රත්නය සරණ යමි.

නිවන් සුව විඳීම පිණිස දෙවනුව ද, බුද්ධ රත්නය සරණ යමි. නිවන් සුව විඳීම පිණිස දෙවනුව ද, ධම්ම රත්නය සරණ යමි. නිවන් සුව විඳීම පිණිස දෙවනුව ද, සංඝ රත්නය සරණ යමි.

නිවන් සුව විඳීම පිණිස තෙවනුව ද, බුද්ධ රත්නය සරණ යමි. නිවන් සුව විඳීම පිණිස තෙවනුව ද, ධම්ම රත්නය සරණ යමි. නිවන් සුව විඳීම පිණිස තෙවනුව ද, සංඝ රත්නය සරණ යමි.

**දේශක :** සරණා ගමනය සම්පූර්ණය

**ශ්‍රාවක :** එසේය ස්වාමින් වහන්ස,

පටුන

## සිකපද සමාදන්වීම.

1. පානාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

3. කාමේසු මිච්ඡා චාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

5. පිසුනා වාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

6. ඵරුසා වාචා  වේරමණී සික්ඛාපදං සමාදියාමි.

7. සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

8. මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

**දේශක** : තිසරණේන සද්ධිං ආජීව අට්ඨමක සීලං ධම්මං සාධුකං සුරක්කිතං කත්වා. අප්පමාදේන සම්පාදේතබ්බං

**ශ්‍රාවක** : ආම භන්තේ,

## සිකපදයන්ගේ තේරුම

1. ප්‍රාණඝාතයෙන් හෙවත් සතුන් මැරිමෙන් වැළකීමේ ශික්‍ෂා පදය සමාදන් වෙමි.

2. අදින්නාදයෙන් හෙවත් අනුන් සතු ඔවුන් කැමැත්තෙන් නුදුන් දෙය සොර සිතින් ගැනීමෙන් වැළකීමේ ශික්‍ෂා පදය සමාදන් වෙමි.

3. කාම මිථ්‍යාචාරයෙන් හෙවත් කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්‍ෂා පදය සමාදන් වෙමි.

4. මුසාවාදයෙන් හෙවත් දැන දැන බොරු කීමෙන් වැළකීමේ ශික්‍ෂා පදය සමාදන් වෙමි.

පටුන

5. පිසුණු වචනයෙන් හෙවත් කේළම් කිමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

6. එරුෂ වචනයෙන් හෙවත් නපුරු වචන කීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

7. සම්ඵප්ප්‍රලාපයෙන් හෙවත් හිස් වචන කීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

8. මිථ්‍යා ආජීවයෙන් හෙවත් අධර්ම ජීවිකාවෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

**දේශක අනුශාසනාව :**

තිසරණ සහිත ආජීව අෂ්ටමක සීල ධර්මය මනාව සුරක්ෂිත කොට සිහි නුවණින් දියුණු කළ මැනැවි.

**ශ්‍රාවක පිළිගැනිම:** එසේය ස්වාමින් වහන්ස.

පටුන

# 02 බුද්ධානුස්සති භාවනාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ, සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා,ති.

**අනුලෝම :**

අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්මසාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධෝ, භගවා.

**ප්‍රතිලෝම :**

භගවා, බුද්ධෝ, සත්ථා දේවමනුස්සානං, අනුත්තරෝ පුරිසදම්මසාරථී, ලෝකවිදූ, සුගතෝ, විජ්ජාචරණසම්පන්නෝ, සම්මා සම්බුද්ධෝ, අරහං.

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම.**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

**තේරුම :** ආජඤ්ඤ පුරුෂ වූ බුදුරජාණන් වහන්ස! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

උත්තම පුරුෂ වූ බුදුරජාණන් වහන්ස! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

අසම පුරුෂ වූ බුදුරජාණන් වහන්ස! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

ශ්‍රේෂ්ඨ පුරුෂ වූ බුදුරජාණන් වහන්ස! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

පටුන

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **අර්හත්** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **සම්මා සම්බුද්ධ** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **විජ්ජාචරණ සම්පන්න** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **සුගත** නම් වන සේක

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **ලෝකවිදූ** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **අනුත්තර පුරිසදම්මසාරථී** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **සත්ථා දේවමනුස්සානං** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **බුද්ධ** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **භගවා** නම් වන සේක

(අග සිට මුලට පිළිවලින් කියවන්න)

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ **භගවා** නම් වන සේක. ....

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

පටුන

## පද සම්බන්ධය

සෝ භගවා ඉතිපි අරහං. සෝ භගවා ඉතිපි සම්මා සම්බුද්ධෝ. සෝ භගවා ඉතිපි විජ්ජාචරණසම්පන්නෝ. සෝ භගවා ඉතිපි සුගතෝ. සෝ භගවා ඉතිපි ලෝකවිදූ. සෝ භගවා ඉතිපි අනුත්තරෝ පුරිසදම්මසාරථී. සෝ භගවා ඉතිපි සත්ථා දේවමනුස්සානං. සෝ භගවා ඉතිපි බුද්ධෝ. සෝ භගවා ඉතිපි භගවා.

සෝ භගවා ඉතිපි භගවා. සෝ භගවා ඉතිපි බුද්ධෝ. සෝ භගවා ඉතිපි සත්ථා දේවමනුස්සානං. සෝ භගවා ඉතිපි අනුත්තරෝ පුරිසදම්මසාරථී. සෝ භගවා ඉතිපි ලෝකවිදූ. සෝ භගවා ඉතිපි සුගතෝ. සෝ භගවා ඉතිපි විජ්ජාචරණසම්පන්නෝ. සෝ භගවා ඉතිපි සම්මා සම්බුද්ධෝ. සෝ භගවා ඉතිපි අරහං.

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ,**

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **අර්හත්** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **සම්මා සම්බුද්ධ** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **විජ්ජාචරණසම්පන්න** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **සුගත** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **ලෝකවිදූ** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **අනුත්තර පුරිසදම්මසාරථී** නම් වන සේක.

පටුන

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **සත්ථා දේවමනුස්සානං** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **බුද්ධ** නම් වන සේක.

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **භගවා** නම් වන සේක. (අග සිට මුලට කියවන්න)

ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද **භගවා** නම් වන සේක.....

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

පටුන

# 03 අරහං බුදු ගුණය (පාළි)

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස///

1. සෝ භගවා ඉතිපි අරහං

**2. සෝ භගවා ආරකත්තා ඉතිපි අරහං**

3. සෝ භගවා ලෝභ කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං

4. සෝ භගවා දෝස කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං

5. සෝ භගවා මෝහ කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං

6. සෝ භගවා මාන කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං

7. සෝ භගවා දිට්ඨි කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං

8. සෝ භගවා විචිකිච්චා කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං

9. සෝ භගවා ථීන කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං.

10.සෝ භගවා උද්ධච්ච කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං.

1 1 . සෝ භගවා අහිරික කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං.

12.සෝ භගවා අනොත්තප්ප කිලේස වත්ථුතෝ ආරකත්තා ඉතිපි අරහං.

**13.සෝ භගවා අරීනං හතත්තා ඉතිපි අරහං.**

14.සෝ භගවා සෝතාපත්ති මග්ගේන අරීනං හතත්තා ඉතිපි අරහං.

15.සෝ භගවා සකදාගාමි මග්ගේන අරීනං හතත්තා ඉතිපි අරහං.

16. සෝ භගවා අනාගාමි මග්ගේන අරීනං හතත්තා ඉතිපි අරහං.

17. සෝ භගවා අරහත්ත මග්ගේන අරීනං හතත්තා ඉතිපි අරහං.

පටුන

**18. සෝ භගවා අරානං හතත්තා ඉතිපි අරහං.**

19. සෝ භගවා අරියමග්ගේන අවිජ්ජා අරානං හතත්තා ඉතිපි අරහං.

20. සෝ භගවා අරියමග්ගේන සංඛාර අරානං හතත්තා ඉතිපි අරහං.

21. සෝ භගවා අරියමග්ගේන විඤ්ඤාණ අරානං හතත්තා ඉතිපි අරහං.

22. සෝ භගවා අරියමග්ගේන නාමරූප අරානං හතත්තා ඉතිපි අරහං.

23. සෝ භගවා අරියමග්ගේන සළායතන අරානං හතත්තා ඉතිපි අරහං.

24. සෝ භගවා අරියමග්ගේන ඵස්ස අරානං හතත්තා ඉතිපි අරහං.

25. සෝ භගවා අරියමග්ගේන වේදනා අරානං හතත්තා ඉතිපි අරහං.

26. සෝ භගවා අරියමග්ගේන තණ්හා අරානං හතත්තා ඉතිපි අරහං.

27. සෝ භගවා අරියමග්ගේන උපාදාන අරානං හතත්තා ඉතිපි අරහං.

28. සෝ භගවා අරියමග්ගේන භව අරානං හතත්තා ඉතිපි අරහං.

29. සෝ භගවා අරියමග්ගේන ජාති අරානං හතත්තා ඉතිපි අරහං.

30. සෝ භගවා අරියමග්ගේන ජරා, මරණ අරානං හතත්තා ඉතිපි අරහං.

**31. සෝ භගවා ආමිස පූජාය අරහත්තා ඉතිපි අරහං.**

**32.සෝ භගවා පටිපත්ති පූජාය අරහත්තා ඉතිපි අරහං.**

**33. සෝ භගවා පාප කාරණේ රහාභාවා ඉතිපි අරහං.**

පටුන

# 04 අරහං බුදුගුණය තේරුම

01. ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේ ද,අර්හත් නම් වන සේක.

**02.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත සකල ක්ලේශයන් කෙරෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.**

03.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත ලෝභ, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

04 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත ද්වේශ, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

05 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත මෝහ, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

06 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත මාන, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

07 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත දෘෂ්ටි, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

08 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත විචිකිච්චා, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

09 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත ථීන, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

10 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත උද්ධච්ච, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

11 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත අහිරික, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

පටුන

12 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත අනොත්තප්ප, ක්ලේශ වස්තුවෙන්, දුරු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

**13 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ වාසනා සහිත රාගාදී කෙළෙස් සතුරන් නැසූ හෙයින්ද, අර්හත් නම් වන සේක.**

14 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ සෝතාපත්ති මාර්ගයෙන් කෙළෙස් සතුරන් නැසූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

15 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ සකදාගාමී මාර්ගයෙන් කෙළෙස් සතුරන් නැසූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

16 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ අනාගාමී මාර්ගයෙන් කෙළෙස් සතුරන් නැසූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

17 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ අර්හත් මාර්ගයෙන් කෙළෙස් සතුරන් නැසූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

**18 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ සංසාර චක්‍රයේ අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.**

19 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් අවිද්‍යා අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

20 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් අභිසංස්කාර අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

21 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් විඥාන අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

22 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් නාම රූප අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

පටුන

23 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් සළායතන අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

24 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් ඵස්ස අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

25 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් වේදනා අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

26 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් තෘෂ්ණා අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

27 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් උපාදාන අර සිඳාලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

28 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් භව අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

29 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් ජාති අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

30 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආර්‍ය්‍ය මාර්ගයෙන් ජරා මරණ අර සිඳලූ හෙයින්ද, අර්හත් නම් වන සේක.

**31 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ආමිස පූජාවන්ට සුදුසු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.**

**32 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වූ හෙයින්ද, අර්හත් නම් වන සේක.**

**33 ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ රහසිනුත් පවක් නැති අති පරිසුද්ධ, සන්තානයක් ඇති හෙයින්ද, අර්හත් නම් වන සේක.**

පටුන

## විපස්සනා

1. බුද්ධානුස්සති භාවනා සමයේ පාතුභූතා නාමරූපධම්මා ඛණේ ඛණේ උප්පජ්ජිත්වා නිරුද්ධත්තා අනිච්චා.

2. උප්පාද - නිරෝධ පතිපීළිතත්තා දුක්ඛා.

3. අත්තනෝ අත්තනෝ වසේ අප්පවත්තිතත්තා අනත්තා.

4. අනිච්චා, දුක්ඛා, අනත්තා, නාමරූපධම්මා එකන්තේන දුක්ඛසච්චං නාම හෝති.

5. තං සමුට්ඨාපිකා පුරිමා භවතණ්හා ඒකන්තේන සමුදයසච්චං නාම හෝති.

6. තේසං උභින්නං අප්පවත්ති සඞ්ඛාත නිබ්බාණධාතු ඒකන්තේන නිරෝධසච්චං නාම හෝති.

7. තස්සේව නිරෝධසච්චස්ස අධිගමාය භාවේතබ්බෝ පටිපත්ති මග්ගෝ ඒකන්තේන මග්ගසච්චං නාම හෝති.

8 ඉදං මේ බුද්ධානුස්සති භාවනාමයං පුඤ්ඤං ඉමේසං චතුන්නං අරියසච්චානං අභිසම්බෝධාය උපනිස්සයෝ හෝතු

සාධු! සාධු!! සාධු!!!

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම,**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ.**

පටුන

## විදර්ශනාවට නැංවීම

බුදුගුණ භාවනාවේදී පහළ වූ නාම රූපයෝ ක්‍ෂණයක්, ක්‍ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය, ඇති වීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.

අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම - රූප සමූහය ඒකාන්තයෙන්ම දුක්ඛ සත්‍ය නම් වේ. ඒ දුක්ඛ සත්‍ය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍ය නම් වේ. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් නිරෝධ සත්‍ය නම් වේ. ඒ නිරෝධ සත්‍ය අවබෝධ කර ගැනීමට වැඩිය යුතු ප්‍රතිපත්ති මාර්ගය ඒකාන්තයෙන් මාර්ග සත්‍ය නම් වේ.

මගේ බුදුගුණ භාවනාමය කුශලය මෙම චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කර ගැනීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

සාධු! සාධු!! සාධු!!!

ආජඤ්ඤ පුරිස වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

උත්තම පුරිස වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

අසම පුරිස වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

ශ්‍රේෂ්ඨ පුරිස වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

පටුන

# 05 අරහං පද විවරණය

1. **අරහං** යනු :- **ආරක**- දුරස්ථ බව, **අරීනං හත** - සතුරන් නැසූ බව, **අරානං හත** - අවයව නැසූ බව, **අරහ** - සුදුසු බව, **නරහ** - රහසක් නොමැති බව, යන අර්ථ ඇති වචනයකි.

(විසුද්ධිමග්ග)

2. **ආරකත්තා** යනු, වාසනා සහිත වූම 1500ක් පමණ සකල ක්ලේශයන් කෙරෙන්ම දුර්න්ම දුරු වූ  බවයි. (විභංග පාළි)

3. **ලෝභ** යනු, ඉටු අරමුණෙහි ඇලෙන ලෝභ චෛතසිකය.

4. **දෝස** යනු - අනිටු අරමුණෙහි ගැටෙන දෝස චෛතසිකය.

5. **මෝහ** යනු, සෑම අරමුණෙහි යථා තත්ත්වය නොදැන මුලාවන මෝහ චෛතසිකය.

6. **මාන** යනු උසස් පහත් භේදයෙන් මනින මාන චෛතසිකය.

7. **දිට්ඨි** යනු - අසත්‍ය ධර්මය සත්‍යක් සේ වැරැදිව ගන්නා වූ දිට්ඨි චෛතසිකය.

8. **විචිකිච්චා** යනු, බුද්ධාදි අට තැන්හි ස්ථිරවම නොපිළිගෙන කෙසේදැයි සැක කරන, විචිකිච්චා චෛතසිකය.

9. **ථීන** යනු-  සිතේ උත්සාහය යටපත් කරන් මැලිබව වූ ථීන චෛතසිකය.

10. **උද්ධච්ච** යනු - සිත නොසන්සුන් බවට පත් කරන උද්දච්ච චෛතසිකය.

11. **අහිරික** යනු - පාපයෙහි ලැජ්ජා නැති බව නම් වූ අහිරික චෛතසිකය.

12 **අනොත්තප්ප** යනු - පාපයෙහි බියපත් නොවීම නම් වූ අනොත්තප්ප චෛතසිකය.

පටුන

13. **අරි** යන - සකල අනර්ථයම ගෙන දෙන බැවින් සියලු කෙළෙස්ම අරී - සතුරෝ නම් වෙති.

( මේ දස ක්ලේෂ වස්තු විභංග පාළියෙනි)

14. **සෝතාපත්ති මග්ග** - නිර්වාන සාගරය වෙත ගලායන ආර්ය අෂ්ඨාංගික මාර්ග සෝතයට පළමුවෙන් බැස ගන්නා වූ, සක්කාය දිට්ඨි, විචිකිච්චා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුන ප්‍රහාණය කළ ඥානයයි.

15. **සකෘදාගාමී මග්ග** - ප්‍රතිසන්ධි ගැනීමට එක් වරක් පමණක් නැවත මනු ලොවට පැමිණිය හැකි වූ, කාමරාග - පටිඝ - යනු සංයෝජන දෙක තුනී කරන්නා වු දෙවෙනි මාර්ග ඥානයයි.

16. **අනාගාමි මග්ග** - නැවත එකොළොස් කාම භූමියෙහි ප්‍රතිසන්ධි ගැනීමට නොඑන්නා වූද, කාමරාග- පටිඝ යන දෙක සම්පූර්ණයෙන්ම ප්‍රහාණය කරන්නා වූ තෙවෙනි මාර්ග ඥානයයි.

17. **අරහත්ත මග්ග** - අවශේෂ, රූපරාග - අරූපරාග - මාන - උද්දච්ච - අවිජ්ජා සහිත සකල ක්ලේශයන් ප්‍රහාණය කරන්නා වූ සියළු පූජාවන්ට සුදුසු අග්‍ර දක්ෂිණාර්හ බවට පමුණුවන සතරවෙනි මාර්ග ඥානයයි.

(ධම්මසඞ්ගනි)

18. **අරානං** යනු - ක්ලේෂ වට්ට - කම්ම වට්ට - විපාක වට්ට - තුනෙකින් යුක්ත වූ සංසාර චක්‍රයේ අවයවයෝය.

(විසුද්ධි මග්ග)

19. **අවිජ්ජා** - ආයර්‍ය සත්‍ය මුවහ කරන මෝහ චෛතසිකය.

20. **සඞ්ඛාර** - පුණ්‍යාභිසංස්කාර = කාමාවචර - රූපාවචර කුශල චේතනා 13, අපුණ්‍යාභිසංස්කාර - අකුශල චේතනා 12, ආනෙඤ්ජාභිසංස්කාර - අරූපාවචර කුසල චේතනා 4 යන චේතනා 29, එකුන්තිස වෙති. අභිධර්ම නය ක්‍රමයට අනුව චේතනා 89 එකුන් අනුවම ගැනෙති.

පටුන

21. **විඤ්ඤාණ** - ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති ලෞකික විපාක, විඤ්ඤාණ සිත් 32 වෙති. අභිධර්ම න්‍යායට අනුව සිත් 89 (අසූනවයම) ගැනෙති.

22. **නාමරූප** ලෞකික විපාක සිත් (32) දෙතිසෙහි යෙදෙන චෛතසික (35) පන්තිස හා කර්මජ රූප 20 ලැබෙති. අභිධර්ම ක්‍රමයට අනව චෛතසික (52) දෙපනස හා අට විසි රූපය ගැනෙති.

23. **සළායතන** - චක්ඛු - සෝත - ඝාන - ජිව්හා - කාය යන ප්‍රසාද රූප පස හා ලෞකික විපාක සිත් (32) දෙතිස ගැනෙති අභිධර්මයට අනුව සියලු සිත් (89) ගැනෙති.

24. **ඵස්ස** - චක්ඛු සම්ඵස්ස - සෝත සම්ඵස්ස - ඝාන සම්ඵස්ස - ජිව්හා සම්ඵස්ස - කාය සම්ඵස්ස හා ලෞකික විපාක සිත්හි ඵස්ස 32 ලැබෙති. අභිධර්මට අනුව ඵස්ස 89 ගැනෙති.

25 **වේදනා** - චක්ඛු සම්ඵස්සජා වේදනා - සෝත - ඝාන - ජිව්හා කාය සම්ඵස්සජා - වේදනා හා ලෞකික විපාක සිත් (32) දෙතිසෙහි මනෝ සම්ඵස්සජා වේදනාව ලැබේ. අභිධර්මයට අනුව වේදනා 89 ගැනෙති.

26 **තණ්හා** කාම තණ්හා - භව තණ්හා - විභව තණ්හා නමින් ඇත්තා වූ රූප තණ්හා - සද්ද - ගන්ධ - රස - ඵොට්ඨබ්බ ධම්ම තණ්හා වශයෙන් බෙදී යන 108 වැදෑරුම් වූ ලෝභ චෛතසික (8) අට ගැනෙති.

27. **උපාදාන** - කාමුපාදාන - (ලෝභය) දිට්ඨුපාදාන - සීලබ්බතුපාදාන - අත්තවාදුපාදාන, (දිට්ඨිය) ගැනේ.

28. **භව** - කර්ම භවය, ලෞකික කුසල් 17. අකුසල් 12 හා තත් සම්ප්‍රයුත්ත චෛතසික 52 වෙති. උප්පත්ති භවය නම්, කාම භව - රූප - අරූප, සඤ්ඤා - අසඤ්ඤා - නෙවසඤ්ඤානාසඤ්ඤා, ඒකවෝකාර - චතු වෝකාර - පඤ්චවෝකාර භව නම් වූ නව මහා භවයයි.

29 **ජාති** - අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික, වශයෙන් උපදින සත්වයන්ගේ ප්‍රතිසන්ධි සිත් 19 චෛතසික 35 කර්මජ රූප 20 යන මේ නාමරූප ස්කන්ධයන්ගේ පළමු හට ගැන්මය.

පටුන

30 **ජරා මරණ** - උපන් ස්කන්ධයන්ගේ දිරාපත්වීම නම් වූ ඨිතිය හා මරණයේ බිඳී යාම නම් වූ භංගයයි (19 සිට 30 දක්වා විභංග පාළි හා ධාතු කතා)

31. **ආමිස පූජා** - චීවරාදි සිව්පසයෙන් කෙරෙන පූජා සත්කාර.

32. **පටිපත්ති පූජා** - සීල, ධුතංග, සමථ, විපස්සනා ආදී ප්‍රතිපත්ති පූජාව.

33. **රහාභාවා** - අනුසය සහිත වුම, ක්ලේශයෙන් කෙරෙන් දුරු වූ බැවින් රහසින්වත් පාපයක් නොමැති බවයි.

(විසුද්ධි මග්ග)

පටුන

# 06 සම්මා සම්බුද්ධ ගුණය (පාළි)

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

01. සෝ භගවා ඉතිපි සම්මා සම්බුද්ධෝ

02.සෝ භගවා අභිඤ්ඤෙය්‍යෙ ධම්මේ අභිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

03.සෝ භගවා පරිඤ්ඤෙය්‍යෙ ධම්මේ පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

04.සෝ භගවා ජාති දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

05.සෝ භගවා ජරා දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

06.සෝ භගවා මරණ දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

07.සෝ භගවා සෝක දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

08.සෝ භගවා පරිදේව දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

09.සෝ භගවා දුක්ඛ දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

10.සෝ භගවා දෝමනස්ස දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

පටුන

11.සෝ භගවා උපායාස දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

12.සෝ භගවා අප්පියේහි සම්පයෝග දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

13.සෝ භගවා පියේහි විප්පයෝග දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

14.සෝ භගවා යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

15.සෝ භගවා සඞ්ඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධ දුක්ඛං පරිඤ්ඤෙය්‍යතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

16.සෝ භගවා පහාතබ්බේ ධම්මේ පහාතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

17.සෝ භගවා කාම තණ්හං පහාතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

18.සෝ භගවා භව තණ්හං පහාතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

19.සෝ භගවා විභව තණ්හං පහාතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

20.සෝ භගවා සච්ඡිකාතබ්බේ ධම්මේ සච්ඡිකාතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

21.සෝ භගවා භාවේතබ්බේ ධම්මේ භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

22..සෝ භගවා සම්මා දිට්ඨිං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

පටුන

23.සෝ භගවා සම්මාසඞ්කප්පං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

24..සෝ භගවා සම්මා වාචං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

25.සෝ භගවා සම්මා කම්මන්තං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

26.සෝ භගවා සම්මා ආජීවං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

27.සෝ භගවා සම්මා වායාමං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

28.සෝ භගවා සම්මා සතිං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

29.සෝ භගවා සම්මා සමාධිං භාවේතබ්බතෝ බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

30.සෝ භගවා සංඛාර - විකාර - ලක්ඛණ - පඤ්ඤත්ති - නිබ්බාන සඞ්ඛාතං පඤ්චවිධ ඤෙය්‍ය මණ්ඩලං සම්මා අභිසම්බුද්ධෝ ඉතිපි සම්මා සම්බුද්ධෝ.

පටුන

# 07 සම්මා සම්බුද්ධ ගුණය තේරුම

01. ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක.

02.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ විශිෂ්ඨ ඥානයෙන් දතයුතු සත්‍ය ධර්මයන්, විශිෂ්ඨ ඥානයෙන් අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

03.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ  පිරිසිඳ අවබෝධ කළයුතු වූ දුක්ඛය සත්‍ය, පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

04..ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ ජාති දුක්ඛය පිරිසිඳ  අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

05.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ  ජරා  දුක්ඛය  පිරිසිඳ  අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

06. ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ මරණ දුක්ඛයපිරිසිඳ  අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

07.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ ශෝක දුක්ඛය පිරිසිඳ  අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

08. ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ  කළ යුතු වූ පරිදේව දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

පටුන

09.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ දුක්ඛ දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

10.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ දෝමනස්ස දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

11. ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ උපායාස දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

12. ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ අප්‍රිය සම්ප්‍රයෝග දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

13.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ ප්‍රිය විප්‍රයෝග දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

14.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ කැමති දෙය නොලැබීමේ දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

15.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ පඤ්ච උපාදානස්කන්ධ දුක්ඛය පිරිසිඳ අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

16.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පිරිසිඳ අවබෝධ කළ යුතු වූ සමුදය සත්‍ය ප්‍රහානය කළ බැවින්ද අවබෝධ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

17.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ප්‍රහාණය කළ යුතු වූ කාම තෘෂ්ණාව ප්‍රහාණය කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

පටුන

18.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ප්‍රහාණය කළ යුතු වූ භව තෘෂ්ණාව ප්‍රහාණය කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

19.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ප්‍රහාණය යුතු වූ විභව තෘෂ්ණාව ප්‍රහාණය කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

20.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ප්‍රත්‍යක්ෂ කළ යුතු වූ නිරෝධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කළ බැවින්ද සම්මා සම්බුද්ධ නම් වන සේක.

21.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ මාර්ග සත්‍ය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

22.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා දිට්ඨිය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

23.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා සංකප්පය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

24.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා වාචාව භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

25.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා කම්මන්තය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

26.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා ආජීවය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

පටුන

27.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා වායාමය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

28.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා සතිය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

29.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ භාවනා වශයෙන් වැඩිය යුතු වූ සම්මා සමාධිය, භාවනා වශයෙන් වැඩූ බැවින් ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

30.ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ සංඛාර - විකාර - ලක්ඛණ - පඤ්ඤත්ති - නිබ්බාන නම් වූ පඤ්චවිධ ඥෙයය - මණ්ඩලය පරෝපදේශ රහිතව ස්‍යම්භූඥානයෙන් සර්වප්‍රකාරයෙන් අවබෝධ කළ බැවින්ද, සම්මා සම්බුද්ධ නම් වන සේක.

## විපස්සනා

1. බුද්ධානුස්සති භාවනාසමයේ පාතුභූතා නාමරූපධම්මා ඛණේ ඛණේ උප්පජ්ජිත්වා නිරුද්ධත්තා අනිච්චා.

2. උප්පාද - නිරෝධ පතිපීලිතත්තා දුක්ඛා.

3. අත්තනෝ අත්තනෝ වසේ අප්පවත්තිතත්තා අනත්තා.

4. අනිච්චා දුක්ඛා අනත්තා නාමරූපධම්මා ඒකන්තේන දුක්ඛසච්චං නාම හෝති.

5. තං සමුට්ඨාපිකා පුරිමා භව තණ්හා ඒකන්තේත සමුදයසච්චං නාම හෝති.

පටුන

6. තේසං උභින්නං අප්පවත්ති සඞ්ඛාතා නිබ්බාණධාතු ඒකන්තෙන නිරෝධසච්චං නාමහෝති.

7. තස්සේව නිරෝධසච්චස්ස අධිගමාය භාවේතබ්බෝ පටිපත්තිමග්ගෝ ඒකන්තේන මග්ගසච්චං නාම හෝ.

8. ඉදං මේ බුද්ධානුස්සති භාවනාමයං පුඤ්ඤං ඉමේසං චතුන්නං අරියසච්චානං අභිසම්බෝධාය උපනිස්සයෝ හෝතු.

**සාධු! සාධු!! සාධු!!!**

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

## විදර්ශනාවට නැංවීම

පටිපත්තිමග්ගෝ ඒකන්තේන මග්ගසච්චං නාමහෝති

8. ඉදං මේ බුද්ධානුස්සති භාවනාමයං පුඤ්ඤං ඉමේසං චතුන්නං අරියසච්චානං අභිසම්බෝධාය උපනිස්සයෝ හෝතු

**සාධු සාධු සාධු**

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

## විදර්ශනාවට නැංවීම

බුදුගුණ භාවනාවේදි පහළ වූ නාමරූපයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය. අතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම රූප සමූහය ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වේ. ඒ දුක්ඛ සත්‍යය උපදවන්න වූ පූර්වභව තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම්වේ. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම්වේ. ඒ නිරෝධ සත්‍යය අවබෝධ කරගැනීමට වැඩිය යුතු වූ ප්‍රතිපත්ති මාර්ගය ඒකාන්තයෙන් මර්ග සත්‍ය නම් වේ.

මාගේ බුදුගුණ භාවනාමය කුශලය මෙම චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කර ගැනීම පිණිසම හේතු වේවා වාසනා වේවා.

**සාධු සාධු සාධු**

පටුන

ආජඤ්ඤ පුරිස වූ බුදුරජාණන් වහන්ස,! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

උත්තම පුරිස වූ බුදුරජාණන් වහන්ස,! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

අසම පුරිස වූ බුදුරජාණන් වහන්ස,! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

ශ්‍රේෂ්ඨ පුරුෂ වූ බුදුරජාණන් වහන්ස,! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

පටුන

# 20 අනුත්තර පුරිසදම්මසාරථී පද විවරණය

1. සීලාදි ගුණ සමූහයෙන් තමන් වහන්සේට වඩා උතුම් කෙනෙක් නොමැති බැවින්, අදන්තයන් සුදන්ත බවට පත් කිරීමේ ශ්‍රේෂ්ඨ අචාර්‍ය – වරයාණන් වහන්සේ බැවින් **අනුත්තර පුරිසදම්මසාරථී** නම් වෙති.

2. චාරිත්‍ර - වාරිත්‍ර, ලෞකික ලෝකොත්තර ශීල රාශිය **සීලස්ඛන්ධ** නම්.

3. නවදහස් එකසිය අසූකෝටි පණස්ලක්ෂ තිස්හය දහසක් පමණ වූද, ශික්ෂාපද ශීලය **ප්‍රාතිමොක්ෂ සංවරය සීලය** නම් වේ.

4. චක්ෂුරාදි ෂඩ් ඉන්ද්‍රියන් සතියෙන් සංවර කිරීම, **ඉන්ද්‍රිය සංවර සීලය** යි.

5. මිථ්‍යාජීවයෙන් තොරව දැහැමින් ලද සිවුපසය පිළිගැනීම **ආජීව පාරිසුද්ධි සීලය** යි.

6. දැහැමි සිවුපසය ද, නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට පරිභෝග

කිරීම, **ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය** යි.

7. උපචාර සමාධි - අපර්ණා සමාධි - ලෞකික සමාධි ලෝකෝත්තර සමාධි ආදි සමාධි රාශිය **සමාධිස්කන්ධ** නම්.

8. නීවරණ මැඩලන සමාධිය, කාමාවචර **උපචාර සමාධිය** නම්

9. රූපාවචර චතුස්ක පඤ්චක ධ්‍යාන **රූපාවචර සමාධි** නම්.

10. අරූප සමාපත්ති සතර, **අරූපවචර සමාධි** නම්.

11. මාර්ගඵල සම්ප්‍රයුක්ත සමාධිය **ලෝකේත්තර සමාධිය** යි.

12. සුතමය ඥාණ - චින්තාමය ඥාණ - භාවනාමය ඥාණා දී, අප්‍රමණ ප්‍රඥාරාශිය **ප්‍රඥාස්කන්ධ** නම්.

පටුන

13. ශුද්ධාදී ඉන්ද්‍රියන් පස් දෙනා ගේ භාවිත ප්‍රමාණය මැන ගැනීමේ ඥනය **ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤණයයි.**

14. ආසය - අනුසය - චරිත - අධිමුක්ති, ආදිය දන්නා නුවණ **ආසයානුසය ඤාණය** යි.

15. යමාමහ පෙළහැර පෑමේ නුවණ, **යමකප්‍රාතිහාර්‍ය ඤාණයයි.**

16. දිනපතා සූවිසි කෝටි ලක්ෂ වාරය බැගින් සමවදිනු ලබන කරුණා බ්‍රහ්ම විහාරය පිළිබඳ නුවණ **මහා කරුණා සමාපත්ති ඤණය** යි.

17. සංඛත - අසංඛත සියලු ධර්මයන් සර්වප්‍රකාරයෙන් දන්නා වූ ප්‍රඥාව **සර්වඥතා ඤාණය** යි.

18. ආවරණයක් නොමැතිව සියල්ල විනිවිද දන්නා වු, ප්‍රඥාව, **අනාවරණ ඤාණය** යි. (මේ සය පටිසම්භිදා මග්ගයෙනි)

19. තදංග - විෂ්කම්භන - සමුච්ඡේද - පටිප්පස්සද්ධි - නිස්සරණ යනු **පඤ්චවිධ විමුක්තිස්කන්ධය** යි.

20. ලෝකෝත්තර ඵලාධිගමයට අනතුරුවම ලැබෙන ප්‍රත්‍යවේක්ෂා ඥාන 19, **විමුක්තිඥණදර්ශනස්කන්ධය** යි.

21. දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, අසූ අනුව්‍යඤ්ජන, ලක්ෂණාදියෙන් විසිතුරු වූ අනුපමෙය්‍ය **රූප කාය සම්පත්තියයි.**

22. කාය - වේදනා - චිත්ත - ධම්ම යන සතරාකාරයෙන් පවත්න වූ, සතර **සතිපට්ඨානය** යි.

23. නූපන් අකුසල් නූපදවීම, උපන් අකුශල් නැසීම, නූපන් කුසල් ඉපදවීම, උපන් කුසල් දියුණු කිරිම, යන සතරාකාරයෙන් පහළ වන උතුම් වීර්‍ය්‍ය සතර සම්‍යක්ප්‍රධාන විර්‍ය්‍ය යි.

24. ඡන්ද - චිත්ත - වීරිය - වීමංසා නමින් ඇති **ඍද්ධි පාද සතරය.**

25. සද්ධා - විරිය - සති සමාධි - පඤ්ඤා නමින් ඇති **ඉන්ද්‍රිය ධර්ම පහයි.**

පටුන

26. ඒ ඉන්ද්‍රිය ධර්ම පහම විරුද්ධ ධර්මයන්ගෙන් කම්පා නොවන අර්ථයෙන් **බල ධර්ම** නම් වේ.

27. සති - ධම්මවිචය - විරිය - පීති - පස්සද්ධි - සමාධි - උපේක්ඛා නමින් ඇති මාර්ගඥාන - බෝධියට අංග නමින් ප්‍රත්‍යවන **බොජ්ඣංග සතකි**.

28. සම්මා දිට්ඨි ආදී. **මාර්ගාංග** අටකි.

29. සර්වඥතාඥානය ගැන විසාරද ඥාණය

30. අර්හත් මාර්ග ඥානය ගැන විසාරද ඥාණය

31. කර්ම - ක්ලේශ - විපාක - උපවාද හා ආඥා ව්‍යතික්‍රමණාන්තරාය නම් වූ ධර්ම ගැන විසාරද ඥාණය

32. නෛර්‍යාණික ධර්ම පිළිබඳ විසාරද ඥාණය

33. දමනය කටයුතු වූ, මනුෂ්‍ය - අමනුෂ්‍ය - දිව්‍ය - බ්‍රහ්ම - තිරශ්චීනා දී සත්වයන් විශිෂ්ඨ ලෙස දමනය කරන සේක. (විශුද්ධි මග්ග)

පටුන

# 21 සත්ථා දේවමනුස්සානං බුදුගුණය (පාළි)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

1. සෝ භගවා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

2. සෝ භගවා දිට්ඨධම්මිකේන අත්ථේන යථාරහං අනුසාසති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

3. සෝ භගවා සම්පරායිකේන අත්ථේන යථාරහං අනුසාසති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

4. සෝ භගවා නිබ්බාන පරමත්ථේන යථාරහං අනුසාසති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

5. සෝ භගවා සත්තේ ජාති-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

6. සෝ භගවා සත්තේ ජරා-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

7. සෝ භගවා සත්තේ ව්‍යාධි-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

8. සෝ භගවා සත්තේ මරණ-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

9. සෝ භගවා සත්තේ සෝක-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

10. සෝ භගවා සත්තේ පරිදේව-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

පටුන

11. සෝ භගවා සත්තේ දුක්ඛ-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

12. සෝ භගවා සත්තේ දෝමනස්ස-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

13. සෝ භගවා සත්තේ උපායාස-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

14. සෝ භගවා සත්තේ රාග-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

15. සෝ භගවා සත්තේ දෝස-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

16. සෝ භගවා සත්තේ මෝහ-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

17. සෝ භගවා සත්තේ මාන-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

18. සෝ භගවා සත්තේ දිට්ඨි-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

19. සෝ භාගවා සත්තේ කිලේස-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

20. සෝ භාගවා සත්තේ දුච්චරිත-කන්තාරං තාරේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

21. සෝ භගවා සත්තේ සංසාර-කන්තාරං තාරේති උත්තාරේති නිත්තාරේති, පාතාරේති, ඛේමන්ත භූමිං සම්පාපේති ඉතිපි සත්ථා දේවමනුස්සානං,

22. සෝ භගවා සත්තේ නේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

පටුන

23. සෝ භගවා සත්තේ විනේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

24. සෝ භගවා සත්තේ අනුනේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

25. සෝ භගවා සත්තේ පඤ්ඤාපේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

26. සෝ භගවා සත්තේ නිජ්ඣාපේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

27. සෝ භගවා සත්තේ පෙක්ඛේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

28. සෝ භගවා සත්තේ පසාදේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

29. සෝ භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

30. සෝ භගවා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනේතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

31. සෝ භගවා අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා ඉතිපි සත්ථා දේවමනුස්සානං,

32. සෝ භගවා මග්ගඤ්ඤු ඉතිපි සත්ථා දේවමනුස්සානං,

33. සෝ භගවා මග්ගවිදූ ඉතිපි සත්ථා දේවමනුස්සානං,

34. සෝ භගවා මග්ගකෝවිදෝ ඉතිපි සත්ථා දේවමනුස්සානං,

35. සෝ භගවා මග්ගානුගා ච පනස්ස එතරහි සත්තා විහරන්ති පච්ඡා සමන්නාගතා, ඉතිපි සත්ථා දේවමනුස්සානං,

පටුන

# 22 සත්ථා දේවමනුස්සානං බුදුගුණය තේරුම

01. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙසේ ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

02. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෙලොව හිතවැඩ පිණිස අනුශාසනා කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

03. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පරලොව හිතවැඩ පිණිස අනුශාසනා කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

04. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මගඵලනිවන් සුව පිණිස අනුශාසනා කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

05. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මරණ කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

06. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ජරා කන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

07. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ව්‍යාධි කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථාදේවමනුස්සානං වන සේක.

08. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මරණ කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

09. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ ශෝක කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

10. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ පරිදේව කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

පටුන

11. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ කායික දුක්ඛ කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

12. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මානසික දෝමනස්ස කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

13. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ උපායාස කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

14. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ රාග කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

15. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ දෝෂ කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

16. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මෝහ කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

17. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මාන කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

18. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ මිසදිටු කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින් ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

19. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ කෙලෙස් කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

20. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ දුශ්චරිත කාන්තාරයෙන් සත්වයන් එතර කළ බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

පටුන

21. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ සංසාර කාන්තාරනේ සත්වයන් එතර කරවා නිර්වාණ ක්ෂේම භූමියට පමුණුවා වදාළ බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

22. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ සත්වයන් නිවන් පුර පමුණුවන බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

23. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ සත්වයන් විනයෙහි පිහිටුවන බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

24. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ විමති සිඳිමින් දහම් දෙසන බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

25. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ අර්ථය වටහා දෙමින් දහම් දෙසන බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

26. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ අර්ථ තීරණය කරමින් දහම් දෙසන බැවින්ද, සත්ථ දේවමනුස්සානං වන සේක.

27. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ ප්‍රතිපත්තියෙහි පිහිටුවමින් දහම් දෙසන බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

28. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ ප්‍රතිපත්ති ඵලයෙහි රස විහිදුවමින්, පිළිවෙතෙහි පිහිටියවුන්ව පහදවමින් දහම් දෙසන බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

29. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ තමන්ගේ සිත් සතන්හි පෙර නූපන් නිවන්මග ඉපද වූ බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

30. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ අනුන්ගේ සිත් සතන්හි නූපන් නිවන්මග ඉපද වූ බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

පටුන

31. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ බෝධිසත්වයනට විවරණ දෙමින් නිවන් මග පෙන්වූ බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

32. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ තමන් ඉපද වූ නිවන් මග දන්නා බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

33. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ අනුන්ට උපදින නිවන් මග දන්නා බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

34. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ බෝධිසත්වයනට උපදින නිවන් මග දන්නා බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

35. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,! ඔබ වහන්සේ ගමන්ගත් නිවන් මග අන් අයද ගමන් කරවූ බැවින්ද, සත්ථා දේවමනුස්සානං වන සේක.

## විපස්සනා

1. බුද්ධානුස්සති භාවනා සමයේ පාතුභූතා නාමරූපධම්මා ඛණේ ඛණේ උප්පජ්ජිත්වා නිරුද්ධත්තා අනිච්චා

2. උප්පාද - නිරෝධ පතිපීළිතත්තා දුක්ඛා

3. අත්තනෝ අත්නෝ වසේ අප්පවත්තිතත්තා අනත්තා

4. අනිච්චා දුක්ඛා අනත්තා නාමරූපධම්මා ඒකන්තේන දුක්ඛසච්චං නාම හෝති

5. තං සමුට්ඨාපිකා පුරිමා භවතණ්හා ඒකන්තේන සමුදයසච්චං නාම හෝති

6. තේසං උභින්නං අප්පවත්ති සඞ්ඛාතා නිබ්බාණධාතු ඒකන්තේන නිරෝධසච්චං නාම හෝති

පටුන

7. තස්සේව නිරෝධසච්චස්ස අධිගමාය භාවේතබ්බෝ පටිපත්තිමග්ගෝ ඒකන්තේන මග්ගසච්චං නාම හෝති

8. ඉදං මේ බුද්ධානුස්සති භාවනාමයං පුඤ්ඤං ඉමේසං චතුන්නං අරියසච්චානං අභිසම්බෝධාය උපනිස්සයෝ හෝතු

**සාධු සාධු සාධු**

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

ආජඤ්ඤ පුරිස වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

උත්තම පුරිස වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

අසම පුරිස වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

ශ්‍රේෂ්ඨ පුරුෂ වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

## විදර්ශනාවට නැංවීම

බුදුගුණ භාවනාවේදි පහළ වූ නාමරූපයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

පටුන

අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම රූප සමූහය ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වේ. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම්වේ. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම්වේ. ඒ නිරෝධ සත්‍යය අවබෝධ කරගැනීමට වැඩිය යුතු වූ ප්‍රතිපත්ති මාර්ගය ඒකාන්තයෙන් මාර්ග සත්‍ය නම් වේ.

මාගේ බුදුගුණ භාවනාමය කුශලය මෙම චතුරාර්ය සත්‍ය ධර්මයෙන් අවබෝධ කර ගැනීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

**සාධු සාධු සාධු**

පටුන

# 23 සත්ථා දේවමනුස්සානං පද විවරණය

1. ලොවී ලොවුතුරා සුවය පිණිස අනුශාසනා කරන බැවින් හා, සසර කතරින් සත්වයන් එතර කරන බැවින්ද **සත්ථා දේවමනුස්සානං** වන සේක.

2. **දිට්ඨධම්මික** : මෙලොව යහපත

3. **සම්පරායික** : පරලොව යහපත

4. **පරමත්ථ** : නිර්වාණාවබෝධය

5. **කාන්තරං** : චෝර - ව්‍යාළ - අමනුෂ්‍ය - නිරුදක - අප්පභක්ඛ නමින් කාන්තාර 5 කි. මහත් වනගහන බැවින් ද, මහත් අනර්ථ ඇති බැවින් ද එතර යා නොහෙන බැවින් ද, මේවා කාන්තාර නම් වෙති.

**ජාතිය** : නැවත නැවත තුන් භවයෙහි ඉපදීම නම් වූ ජාති කාන්තාරය ප්‍රතිසන්ධි සිත් 19: චෛතසික 35 : කර්මජ රූප 20 ය.

6. **ජරා** : උපන් ස්ඛන්ධයන් ගේ, මේරීම, දිරීම, නාම-රූප ඨිතිය යි.

7. **ව්‍යාධි** - රෝගාබාධ-ස්කන්ධයන්ගේ පෙළීම.

8. **මරණ** : ජීවිතක්ෂයට පැමිණීම, නාම-රූප භංගය යි.

9. **සෝක** : චිත්ත සන්තාපය, මානසික දුක්ඛ වේදනාව මය

10. **පරිදේව** : හැඬීම-වැළපීම, චිත්ත විපර්යාස ශබ්ද රූපය,

11. **දුක්ඛ** : කායික දුක, දුක්ඛ සහගත කායවිඤ්ඤාණ සිතෙහි යෙදෙන වේදනාව

12. **දෝමනස්ස** : මානසික දුක, පටිඝ සිත් දෙකෙහි ඇති වේදනාව

13. **උපායාස** : විපත් නිසා සිතෙහි පහළ වන අධික දාහය, පටිඝය යි.

පටුන

14. **රාග** : අරමුණෙහි ඇලීම, ලෝභ චෛතසික 8 කි.

15. **දෝස** : අරමුණෙහි ගැටීම, ද්වේෂ චෛතසික 2 කි.

16. **මෝහ** : අරමුණෙහි මුලාවීම, මෝහ චෛතසක 12 කි

17. **මාන** : උඩඟු බව, මාන චෛතසික 4 කි.

18. **දිට්ඨි** : වැරදි දෘෂ්ටි 62 කි. දිට්ඨි චෛතසික 4 කි.

19. **කිලේස** : සන්තානය දවන තවන අර්ථයෙන් ක්ලේශ නම්. වස්තු වශයෙන් 10 කි. ප්‍රභේද 1, 500 කි

20. **දුච්චරිත** : අයහපත් හැසිරීම, කායික, 3, වාචසික 4, මානසික 3, සියල්ල 10 කි.

21. **සංසාර** : ස්කන්ධ-ආයතන-ධාතුන් ගේ දිගට පැවැත්ම, තාරෙති : බියකරු සසරින්, එතර කරවයි. උත්තාරේති : ක්ෂෙමාන්ත භූමියට පමුණුවයි. නිත්තාරේති : බියකරු සසරින් නික්මවයි. පාතාරේති : අතින් ගෙන ඔසවා තබන්නා සේ, ශාන්ති පුරයට පමුණුවයි.

22. **නේතා** : නිවනට පමුණුවයි.

23. **විනේතා** : සංවර විනයෙහි, ප්‍රහාණ විනයෙහි පිහිටුවයි.

24. **අනුනේතා** : විමති සිඳිමින් දහම් දෙසයි

25. **පඤ්ඤාපේතා** : අර්ථය පණවයි

26. **නිජ්ඣාපේතා** : අර්ථ විනිශ්චය කරවයි

27. **පෙක්ඛේතා** : ප්‍රතිපත්තිය පෙන්වයි

28. **පසාදේතා** : ප්‍රතිපත්ති ඵල රසය ගෙන දෙමින් පහදවයි.

29. **අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදේතා** : සවසන්තානයේ නූපන් නිවන් මග උපදවයි.

පටුන

30. **අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනේතා** : අනුන්ගේ සන්තානයේ නුපන් නිවන්මග උපදවයි.

31. **අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා** : බෝසත්නට විවරණ දෙමින් නිවන් මග පෙන්වයි.

32. **මග්ගඤ්ඤූ** : තමන් උපදවා ගත් නිවන් මග දනී.

33. **මග්ගවිදූ** : අනුන්ට උපදින නිවන් මග දනී.

34. **මග්ගකෝවිදෝ** : බෝසත්නට මතු උපදින නිවන මග දනී.

35. **මග්ගානුගා** : ශාස්තෘන් වහන්සේ ගමන්ගත් නිවන් මග අනුව ශ්‍රාවකයන්ද නිවනට යවන්නාහ. (මහා නිද්දේස පාලි)

පටුන

# 24 බුද්ධෝ බුදුගුණය (පාළි)

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

1. සෝ භගවා ඉතිපි බුද්ධෝ,

2. සෝ භගවා බුජ්ඣිතා සච්චානි ඉතිපි බුද්ධෝ

3. සෝ භගවා බෝධේතා පජාය ඉතිපි බුද්ධෝ

4. සෝ භගවා දුක්ඛස්ස පිළනට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

5. සෝ භගවා දුක්ඛස්ස සඞ්ඛතට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

6. සෝ භගවා දුක්ඛස්ස සන්තාපට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

7. සෝ භගවා දුක්ඛස්ස විපරිණාමට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

8. සෝ භගවා සමුදයස්ස ආයූහණට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

9. සෝ භගවා සමුදයස්ස නිදානට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

10. සෝ භගවා සමුදයස්ස සංයෝගට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

11. සෝ භගවා සමුදයස්ස පළිබෝධට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

පටුන

12. සෝ භගවා නිරෝධස්ස නිස්සරණට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

13. සෝ භගවා නිරෝධස්ස විවේකට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

14. සෝ භගවා නිරෝධස්ස අසඞ්ඛතට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

15. සෝ භගවා නිරෝධස්ස අමතට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

16. සෝ භගවා මග්ගස්ස නියයානට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

17. සෝ භගවා මග්ගස්ස හේතුට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

18. සෝ භගවා මග්ගස්ස දස්සනට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

19. සෝ භගවා මග්ගස්ස ආධිපතෙය්‍යට්ඨං බුජ්ඣිතා, පජාය බෝධේතා ඉතිපි බුද්ධෝ

20. සෝ භගවා සබ්බඤ්ඤුතාය ඉතිපි බුද්ධෝ,

21. සෝ භගවා සබ්බදස්සාවිතාය ඉතිපි බුද්ධෝ,

22. සෝ භගවා අනඤ්ඤනෙය්‍යතාය ඉතිපි බුද්ධෝ,

23. සෝ භගවා විසවිතාය ඉතිපි බුද්ධෝ,

24. සෝ භගවා ඛීණාසව සඞ්ඛාතේන ඉතිපි බුද්ධෝ,

25. සෝ භගවා නිරුපලේප සඞ්ඛාතේන ඉතිපි බුද්ධෝ,

26. සෝ භගවා ඒකන්ත-වීතරාගෝ ඉතිපි බුද්ධෝ,

පටුන

27. සෝ භගවා ඒකන්ත-වීතදෝසෝ ඉතිපි බුද්ධෝ,

28. සෝ භගවා ඒකන්ත-වීතමෝහෝ ඉතිපි බුද්ධෝ,

29. සෝ භගවා ඒකන්ත-නික්කිලේසෝ ඉතිපි බුද්ධෝ,

30. සෝ භගවා ඒකායන-මග්ගං ගතෝ ඉතිපි බුද්ධෝ,

31. සෝ භගවා ඒකෝ අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධෝ ඉතිපි බුද්ධෝ,

32. සේ භගවා අබුද්ධි විහතත්තා ඉතිපි බුද්ධෝ,

33. සෝ භගවා බුද්ධි පටිලාභා ඉතිපි බුද්ධෝ,

පටුන

# 25 බුද්ධෝ බුදුගුණය තේරුම

01. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ මෙසේද බුද්ධ නම් වන සේක.

02. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ආර්‍ය්‍ය සත්‍යයන් අවබෝධ කළ බැවින් ද, බුද්ධ නම් වන සේක.

03. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ අන්‍යයන්ටත් අවබෝධ කරවු බැවින් ද, බුද්ධ නම් වන සේක.

04. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ දුක්ඛ සත්‍යයේ පෙළෙන බව නම් වු පීළනාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යන්ටත් අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

05. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ දුක්ඛ සත්‍යයේ හේතුවෙන් හටගත් බව නම් වු සංඛතාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යන්ට අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

06. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස!, ඔබ වහන්සේ දුක්ඛ සත්‍යයේ තැවෙන බව නම් වු සන්තාපාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

07. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ දුක්ඛ සත්‍යයේ වෙනස්වන බව නම් වු විපරිණාමාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යන්ටත් අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

08. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සමුදය සත්‍යයේ දුක රැස්කිරීම නම් වු ආයුහණාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යන්ටත් අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

පටුන

09. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස!, ඔබ වහන්සේ සමුදය සත්‍යයේ දුකට හේතුවන බව වූ නිදානාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යන්ටත් අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

10. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සමුදය සත්‍යයේ දුකෙහි බැඳෙන බව නම් වූ, සංයෝගාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

11. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සමුදය සත්‍යයේ දුකෙන් මිදීමට නොදෙනබව නම් වූ, පළිබෝධාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

12. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ නිරෝධ සත්‍යයේ දුකෙන් එතරවූ බව නම් වූ, නිස්සරණාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින් ද, බුද්ධ නම් වන සේක.

13. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ නිරෝධ සත්‍යයේ දුකෙන් වෙන්වීම නම් වූ විවේකාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

14. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ නිරෝධ සත්‍යයේ හේතුවකින් හටනොගත් නම් වූ අසංඛතාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

15. ස්වාමීනි, භග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ නිරෝධ සත්‍යයේ මරණයක් නැතිබව නම් වූ අමෘතාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

16. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ මාර්ග සත්‍යයේ නිවනට පමුණුවන බව නම් වූ නීයයාණාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් නම් වන සේක.

පටුන

17. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ මාර්ග සත්‍යයේ නිවනට පමුණුවන බව නම් වූ හේත්වාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

18. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ මාර්ග සත්‍යයේ නිවන දක්නා බව නම් වූ දර්ශනාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

19. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ මාර්ග සත්‍යයේ නිවනට පැමිණීමේ ඉසුරුමත් බව නම් වූ ආධිපතෙය්‍යාර්ථය අවබෝධ කොට වදාරා අන්‍යයන්ටත් අවබෝධ කරවූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

20. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සියල්ල දන්නා බැවින්ද, බුද්ධ නම් වන සේක.

21. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සියල්ල දක්නා බැවින්ද, බුද්ධ නම් වන සේක.

22. ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ අන් කෙනෙකු විසින් නොකළ අවබෝධ ඇති බැවින්ද, බුද්ධ නම් වන සේක.

23. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ කෙළෙස් නින්දෙන් අවදි වූ බැවින්ද බුද්ධ නම් වන සේක.

24. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ආශ්‍රවයන් ක්ෂය කළ බැවින් ද, බුද්ධ නම් වන සේක.

25. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ කෙළෙස් කිලුටක් නොමැති බැවින් ද බුද්ධ නම් වන සේක.

26. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ඒකාන්තයෙන් වීතරාග බැවින් ද, බුද්ධ නම් වන සේක.

27. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ඒකාන්තයෙන් වීතදෝෂ බැවින් ද, බුද්ධ නම් වන සේක.

පටුන

28. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ඒකාන්තයෙන් වීතමෝහ බැවින්ද, බුද්ධ නම් වන සේක.

29. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ඒකාන්තයෙන් නික්ලේශී බැවින් ද, බුද්ධ නම් වන සේක.

30. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ඒකායන මාර්ගයේ ගමන් ගත් බැවින් ද බුද්ධ නම් වන සේක.

31. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ එකලාව ම අනුත්තර සම්මා සම්බෝධියට පැමිණි බැවින්ද, බුද්ධ නම් වන සේක.

32. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ අබුද්ධිය නැසූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

33. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ බුද්ධිය ලැබූ බැවින්ද, බුද්ධ නම් වන සේක.

## විපස්සනා

1. බුද්ධානුස්සති භාවනා සමයේ පාතුභූතා නාමරූපධම්මා ඛණෙ ඛණේ උප්පජ්ජිත්වා නිරුද්ධත්තා අනිච්චා.

2. උප්පාද - නිරෝධ පතිපීළිතත්තා දුක්ඛා.

3. අත්තනෝ අත්තනෝ වසේ අප්පවත්තිතත්තා අනත්තා.

4. අනිච්චා දුක්ඛා අනත්තා නාමරූපධම්මා ඒකන්තේන දුක්ඛසච්චං නාම හෝති.

5. තං සමුට්ඨාපිකා පුරිමා භවතණ්හා ඒකන්තේන සමුදයසච්චං නාම හෝති.

පටුන

6. තේසං උභින්නං අප්පවත්ති සඞ්ඛාතා නිබ්බාණධාතු ඒකන්තේන නිරෝධසච්චං නාම හෝති.

7. තස්සේව නිරෝධසච්චස්ස අධිගමාය භාවේතබ්බෝ පටිපත්තිමග්ගෝ ඒකන්තේන මග්ගසච්චං නාම හෝති.

8. ඉදං මේ බුද්ධානුස්සති භාවනාමයං පුඤ්ඤං ඉමේසං චතුන්නං අරියස්ච්චානං අභිසමේබෝධාය උපනිස්සයෝ හෝතු.

**සාධු සාධු සාධු**

## විදර්ශනාවට නැංවීම

බුදුගුණ භාවනාවේදි පහළ වූ නාමරූපයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම රූප සමූහය ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වේ. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම්වේ. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වේ. ඒ නිරෝධ සත්‍ය අවබෝධ කරගැනීමට වැඩිය යුතු වූ ප්‍රතිපත්ති මාර්ගය ඒකාන්තයෙන් මාර්ග සත්‍ය නම් වේ.

මාගේ බුදුගුණ භාවනාමය කුශලය මෙම චතරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කර ගැනීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

**සාධු සාධු සාධු**

පටුන

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

ආජඤ්ඤ පුරිස වු බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

උත්තම පුරිස වු බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

අසම පුරිස වු බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

ශ්‍රේෂ්ඨ පුරුෂ වු බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

පටුන

# 26 බුද්ධ පද විවරණය

1. **බුද්ධෝ** : තමන්ම ආර්‍ය්‍ය සත්‍ය අවබෝධ කොට අන්හටත් අවබෝධ කරවූ බැවින්, බුද්ධ නම් වෙති.

2. **සච්චානි** : දුක්ඛය-සමුදය-නිරෝධ-මාර්ගය

3. **බෝධේතා පජාය** : අවවාද අනුශාසනාවෙන් විනේයජනයාට අවබෝධ කරවති

4. **පීළනට්ඨ** : උදයව්‍යය-ඇතිවීම් නැතිවීම් දෙකින් නිතරම පෙළෙන බව

5. **සංඛතට්ඨ** : තෘෂ්ණාව ප්‍රධාන කොට ඇති හේතූන්ගෙන් හටගන්නා බව

6. **සන්තාපට්ඨ** : දුක්ගිනි එකොළසකින් නිතරම තැවෙන බව

7. **විපරිණාමට්ඨ** : ජරා මරණයෙන් නිති පෙළෙන බව

8. **ආයූහනට්ඨ** : දුක් උපදින කර්ම රැස්කරන බව

9. **නිදානට්ඨ** : ස්කන්ධ දුකට නිදානය

10. **සංයෝගට්ඨ** : දුකෙන් දුක බැඳ තබන බව

11. **පලිබෝධට්ඨ** : මග පල නිවන් යා නොදී බාධා කරන බව

12. **නිස්සරණට්ඨ** : සසර දුකින් නික්මුණ බව

13. **විවේකට්ඨ** : නාම-රූප ස්කන්ධ දුකින් අමිශ්‍ර බව

14. **අසඞ්ඛතට්ඨ** : හේතු ප්‍රත්‍යයෙන් හට නොගත් ශාන්ත සුවයක් බව

15. **අමතට්ඨ** : මරණයක් නැති බව

16. **නියාානට්ඨ** : අරමුණු කිරීම් වශයෙන් නිවනට නික්මෙන බව

17. **හෙතට්ඨ** : නිවන් පසක් කිරීමේ හේතුව බව

පටුන

18. **දස්සනට්ඨ** : ලක්ෂණ වශයෙන් නිවන අරමුණු කොට දකින බව

19. **ආධිපතෙය්‍යට්ඨ** : අනාථ-අසරණවූ-සසර දුක ඉක්මවා යන බැවින්, ඉන් නැගී සිටි, ඉසුරුමත් බව

20. **සබ්බඤ්ඤුතාය** : ආවර්ජන කළ පමණින් සියල්ල දනී

21. **සබ්බදස්සාවිතාය** : ආවරණ නැතිව සියල්ල විනිවිද දකී.

22. **අනඤ්ඤනෙය්‍යතාය** : අනෙකෙකු නිසා නොව, තමන්ම සියල්ල අවබෝධ කරයි.

23. **විසවිතාය** : තමන්ම සම්මෝහ කෙළෙස් නින්දෙන් අවදි වෙයි.

24. **ඛීණාසවසඞ්ඛාත** : සිවු මග නැණින් සියලු ආශ්‍රව ක්ෂය කරයි.

25. **නිරුපලේපසඞ්ඛාත** : වාසනා සහිත වූම කෙළෙස් ලේප නොමැතියි.

26. **ඒකන්ත-වීතරාග** : අනාගාමී මහ නැණින් කාම රාගයත්, රහත් මග නැණින් භව රාගයත් නසයි.

27. **ඒකන්ත-වීතදෝස** : අනාගාමී මග නැණින් ද්වේශය නසයි

28. **ඒකන්ත-වීතමෝහ** : රහත් මහ නැණින් මෝහය-අවිද්‍යාව නසයි

29. **ඒකන්ත-නික්කිලේස** : සිවු මහ නැණින් 1500 ක් පමණ වූ සියලු කෙළෙසුන් නසා ඒකාන්තයෙන් නික්ලේශී වෙයි.

30. **ඒකායන-මග්ග** : ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය යි.

31. **සම්මා සම්බෝධි** : සර්වඥතා ඥානය

32. **අබුද්ධි** : ආර්‍ය්‍ය සත්‍යයන් වසා සිටි අවිද්‍යාන්ධකාරය

33. **බුද්ධි** : චතුරාර්‍ය්‍ය සත්‍යය සර්වප්‍රකාරයෙන් ස්වයම්භූඥානයෙන් අවබෝධ කරන්නා වූ සර්වඥතාඥානය ප්‍රධාන සකල විධ බුද්ධ ඥාණ ධාතු ප්‍රතිලාභ කළසේක (සියලු පද මහානිද්දේස පාලි)

පටුන

# 27 භගවා බුදු ගුණය (පාළි)

නමෝ තස්ස භගවතේ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

1. සෝ භගවා ඉතිපි භගවා

2. සෝ භගවා භාග්‍යවා ඉතිපි භගවා

3. සෝ භගවා භග්ගවා ඉතිපි භගවා

4. සෝ භගවා භගේහි යුත්තෝ ඉතිපි භගවා

5. සෝ භගවා විභත්තවා ඉතිපි භගවා

6. සෝ භගවා භත්තවා ඉතිපි භගවා

7. සෝ භගවා භවේසු වන්තගමනෝ ඉතිපි භගවා

8. සෝ භගවා භාවිතත්තෝ ඉතිපි භගවා

9. සෝ භගවා භාගීවා චතුන්නං පච්චයානං ඉතිපි භගවා

10. සෝ භගවා භාගීවා අත්ත-ධම්ම-විමුක්තිරසානං ඉතිපි භගවා

11. සෝ භගවා භාගීවා අධිසීල-අධිචිත්ත-අධිපඤ්ඤානං ඉතිපි භගවා

12. සෝ භගවා භාගීවා චතුන්නං ඣානානං ඉතිපි භගවා

13. සෝ භගවා භාගීවා චතුන්නං අප්පමඤ්ඤානං ඉතිපි භගවා

14. සෝ භගවා භාගීවා චතුන්නං අරූප-සමාපත්තීනං ඉතිපි භගවා

15. සෝ භගවා භාගීවා අට්ඨන්නං විමොක්ඛානං ඉතිපි භගවා

16. සෝ භගවා භාගීවා අට්ඨන්නං අභිභායතනානං ඉතිපි භගවා

17. සෝ භගවා භාගීවා නවන්නං අනුපුබ්බ විහාරසමාපත්තීනං ඉතිපි භගවා

පටුන

18. සෝ භගවා භාගීවා දසන්නං සඤ්ඤා භාවනානං ඉතිපි භගවා

19. සෝ භගවා භාගීවා දසන්නං කසිණ සමාපත්තීනං ඉතිපි භගවා

20. සෝ භගවා භාගීවා ආනාපානසති සමාධිස්ස ඉතිපි භගවා

21. සෝ භගවා භාගීවා අසුභ-සමාපත්තීනං ඉතිපි භගවා

22. සෝ භගවා භාගීවා චතුන්නං සතිපට්ඨානානං ඉතිපි භගවා

23. සෝ භගවා භාගීවා චතුන්නං සම්මප්පධානානං ඉතිපි භගවා

24. සෝ භගවා භාගීවා චතුන්නං ඉද්ධිපාදානං ඉතිපි භගවා

25. සෝ භගවා භාගීවා පඤ්චන්නං ඉන්ද්‍රියානං ඉතිපි භගවා

26. සෝ භගවා භාගීවා පඤ්චන්නං බලානං ඉතිපි භගවා

27. සෝ භගවා භාගීවා සත්තන්නං බොජ්ඣඞ්ගානං ඉතිපි භගවා

28. සෝ භගවා භාගීවා අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ඉතිපි භගවා

29. සෝ භගවා භාගීවා දසන්නං බලඤාණානං ඉතිපි භගවා

30. සෝ භගවා භාගීවා චතුන්නං වේසාරජ්ජානං ඉතිපි භගවා

31. සෝ භගවා භාගීවා චතුන්නං පටිසම්භිදානං ඉතිපි භගවා

32. සෝ භගවා භාගීවා ඡන්නං අභිඤ්ඤානං ඉතිපි භගවා

33. සෝ භගවා භාගීවා ඡන්නං බුද්ධධම්මානං ඉතිපි භගවා

පටුන

# 28 භගවා බුදුගුණය තේරුම

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ මෙසේ ද, භගවා නම් වන සේක.

2. ස්වාමීනි, භග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ පාරමිතා නම් වූ පුණ්‍ය භාග්‍යයෙන් සමන්නාගත බැවින් ද, භගවා නම් වන සේක.

3. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ පඤ්ච මාරයන් බිඳ දැමූ බැවින්ද, භගවා නම් වන සේක.

4. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සයක් වූ භාග්‍ය ධර්මයන් ගෙන් සමන්නාගත බැවින් ද, භගවා නම් වන සේක.

5. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සියලු ධර්මයන් බෙදා වදාළ බැවින් ද, භගවා නම් වන සේක.

6. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සේවනය කටයුතු වූ උත්තරී මනුෂ්‍ය ධර්මයන් සේවනය කළ බැවින් ද, භගවා නම් වන සේක.

7. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සසර ගමනට හේතු වූ තෘෂ්ණාව වමාරා ශාන්ත නිවනට සැපත් වූ බැවින්ද, භගවා නම් වන සේක.

8. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ භාවිත ආත්ම ඇති බැවින්ද, භගවා නම් වන සේක.

9. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ චීවරාදී නිවැරදි සිවුපස ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

10. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ අර්ථ-ධර්ම-විමුක්ති රස ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

පටුන

11. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ අධිසීල - අධිචිත්ත - අධිප්‍රඥා ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

12. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සතරක් වූ රූපාවචාර ධ්‍යාන සමාපත්ති ලාභී බැවින් ද, භගවා නම් වන සේක.

13. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සතරක් වූ බ්‍රහ්මවිහාර ධ්‍යාන සමාපත්ති ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

14. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සතරක්වූ අරූපාවචර ධ්‍යාන සමාපත්ති ලාභී බැවින්ද භගවා නම් වන සේක.

15. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ අටක් වූ විමෝක්ෂ ධ්‍යාන සමාපත්ති ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

16. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ අටක් වූ අභිභායතන ධ්‍යාන සමාපත්ති ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

17. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ නවයක් වූ අනුපූර්ව විහාර සමාපත්ති ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

18. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ දස සඤ්ඤා භාවනා ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

19. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ දස කසින සමාපත්ති ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

20. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ආනාපානසති භාවනා ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

21. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ දස අසුභ සමාපත්ති ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

22. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සතර සතිපට්ඨාන ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

පටුන

23. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සතර සම්‍යක් ප්‍රධාන වීර්ය ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

24. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සතර ඍද්ධිපාද ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

25. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ පඤ්ච ඉන්ද්‍රිය ධර්ම ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

26. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ පංචබල ධර්ම ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

27. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සප්ත බොජ්ඣඞ්ග ධර්ම ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

28. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ග ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

29. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ දශ බල ඥාණ ලාභී බැවින්ද භගවා නම් වන සේක.

30. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ චතු විශාරද ඤාණ ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

31. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ චතු පටිසම්භිදා ඤාණ ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

32. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ ෂඩ් අභිඥා ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

33. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ සයක් වූ බුද්ධ ධර්ම ලාභී බැවින්ද, භගවා නම් වන සේක.

පටුන

## විපස්සනා

1. බුද්ධානුස්සති භාවනා සමයේ පාතුභූතා නාමරූපධම්මා ඛණේ ඛණේ උප්පජ්ජිත්වා නිරුද්ධත්තා අනිච්චා.

2. උප්පාද - නිරෝධ පතිපීළිතත්තා දුක්ඛා

3. අත්තනෝ අත්නෝ වසේ අප්පවත්තිතත්තා අනත්තා

4. අනිච්චා දුක්ඛා අනත්තා නාමරූපධම්මා එකන්තෙන දුක්ඛසච්චං නාම හෝති

5. තං සමුට්ඨාපිකා පුරිමා භවතණ්හා එකන්තේන සමුදයසච්චං නාම හෝති

6. තේසං උභින්නං අප්පවත්ති සංඛාතා නිබ්බාණධාතු එකන්තේන නිරෝධසච්චං නාම හෝති

7. තස්සේව නිරෝධසච්චස්ස අධිගමාය භාවේතබ්බෝ පටිපත්තිමග්ගෝ එකන්තේන මග්ගසච්චං නාම හෝති

8. ඉදං මේ බුද්ධානුස්සති භාවනාමයං පුඤ්ඤං ඉමේසං චතුන්නං අරියසච්චානං අභිසම්බෝධාය උපනිස්සයෝ හෝතු

**සාධු සාධු සාධු**

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුලාය - නමෝ තේ පුරිසාසභ**

පටුන

## විදර්ශනාවට නැංවීම

බුදුගුණ භාවනාවේදී පහළ වූ නාමරූපයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය. ඇතිවීම නැතිවීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින්ද දුක්ඛයෝ ය. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම - රූප සමූහය ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වේ. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වේ. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වේ. ඒ නිරෝධ සත්‍ය අවබෝධ කර ගැනීමට වැඩිය යුතු වූ ප්‍රතිපත්ති මාර්ගය ඒකාන්නතයෙන් මාර්ග සත්‍යය නම් වේ.

මාගේ බුදුගුණ භාවනාමය කුශලය මෙම චතුරාර්ය සත්‍ය ධර්මයෙන් අවබෝධ කර ගැනීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

**සාධු සාධු සාධු**

**නමෝ තෝ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**

**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**

ආජඤ්ඤ පුරිස වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

උත්තම පුරිස වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

අසම පුරිස වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

ශ්‍රේෂ්ඨ පුරුෂ වූ බුදුරාජාණන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා

පටුන

# 29 භගවා පද විවරණය

01. **භගවා :** අති ශ්‍රේෂ්ඨතම ගෞරව නාමයකි

02. **භාග්‍යවා :** බෝධිසම්භාර ධර්‍ම නම් වූ පුණ්‍ය භාග්‍ය සම්පත්තිය

03. **භග්ගවා :** ක්ලේශ මාර - ස්කන්ධ, මාර - අභිසංස්කාර, මාර දිව්‍යපුත්‍ර මාර, මච්චු මාර, යන පඤ්ච මාරයන් බෝධි මූලයේ දී, බිඳ දැමූ බව

04. **භගේහි යුත්තෝ :** ඓශ්වර්‍ය්‍ය, ධර්ම, යශ, ශ්‍රී, කාම, ප්‍රයත්න යන භාග්‍ය ධර්මයන්ගෙන්, සමන්නාගත බව

05. **විභත්තවා :** ස්කන්ධ-ආයතන-ධාතු-ඉන්ද්‍රිය-සත්‍ය-පටිච්ච සමුප්පාද ආදී ධර්ම බෙද බෙදා දහම් දෙසූ බව

06. **භත්තවා :** භජනය කටයුතු වූ **ත්‍රිවිධ විවේක :** (කාය විවේක, චිත්ත විවේක, උපධි විවේක), **ත්‍රිවිධ විහරණ :** (දිව්‍ය විහාර, බ්‍රහ්ම විහාර, ආර්‍ය්‍ය විහාර), **ත්‍රිවිධ විමෝක්ෂ :** (සුඤ්ඤත විමෝක්ෂ, අනිමිත්ත විමෝක්ෂ, අප්පණිහිත විමෝක්ෂ) යනාදී උත්තරී මනුෂ්‍ය ධර්ම භජනය කළ බව

07. **භවෙසු වන්ත ගමනෝ :** පුනර් භවය ගෙන දෙන තෘෂ්ණාව ප්‍රධාන භවගාමී කර්ම සියල්ල වමාරා දැමූ බව

08. **භාවිතත්තෝ :** සර්ව සම්පූර්ණ ලෙස පුරුදු කරන ලද, කාය භාවනා, සිල භාවනා චිත්ත භාවනා, ප්‍රඥා භාවනා ඇති බව

09. **චතුන්නං පච්චයානං :** චීවර-පිණ්ඩපාත-සේනාසන-ගිලානප්‍රත්‍යය ය.

10. **අත්ථ-ධම්ම-විමුක්ති රස :** ඵලාවබෝධය අර්ථ රසය යි. හේතු අවබෝධය ධර්ම රසය යි. පඤ්ච විමුක්තිය විමුක්ති රසයයි.

11. **අධිසීල-අධිචිත්ත-අධිපඤ්ඤා :** ලෝකෝත්තර මාර්ග ඵල සම්ප්‍රයුක්ත සීලය, අධි සීලය යි. එහි සමාධිය අධි චිත්තය යි. එහි ප්‍රඥාව අධි ප්‍රඥාවයි.

පටුන

12. **චතුන්නං ඣානානං** : ප්‍රථමධ්‍යානය - ද්‍විතිය - තතිය - චතුර් ධ්‍යානය

13. **අප්පමඤ්ඤානං** : මෙත්තා-කරුණා-මුදිතා-උපේක්ඛා

14. **අරූපසමාපත්තීනං** : ආකාසනඤ්චායතනවිඤ්ඤාණඤ්චායතන-ආකිඤ්චඤ්ඤායතන-නේවසඤ්ඤා නාසඤ්ඤායතන, සමාපත්ති (4) සතරය

15. **අට්ඨන්නං විමොක්ඛානං** : (1) රූපී, රූපානි පස්සති, (2) අජ්ඣත්තං අරූප සඤ්ඤී බහිද්ධා රූපානි පස්සති, (3) සුභන්තේවෙව අධිමුත්තෝ හෝති, (4) ආකාසානඤ්චායතනය, (5) විඤ්ඤාණඤ්චායතන, (6) ආකිඤ්ඤායතනය, (7) නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය, (8) සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්ති යනු අෂ්ට විමෝක්ෂයෝ ය. විරුද්ධ නීවරණයන්ගෙන් මනාව මිදුණ බැවින් මේවා **විමෝක්ෂ** නම් වෙත්.

16. **අට්ඨන්නං අභිභායතනානං** : (1) අජ්ඣත්තං රූප සඤ්ඤීබහිද්ධා රූපානි පස්සති, පරිත්තානි, (2) ... අප්පමාණානි, (3) අජ්ඣත්තං අරූප සඤ්ඤී බහිද්ධා රූපානි පස්සති, පරිත්තානි, (4) .... අප්පමාණානි, (5) නීලානි, (6) පීතකානි, (7) ලෝහිතකානි, (8) ඕදාතානි,..... කුඩා වුවද, මහත් වුවද, සුවර්ණ වූද, දුවර්ණ වූද, අරමුණෙහි නොපමාව ධ්‍යාන උපදවා ගැනීමේ සමත් බව, අභිභායතන නමින් කිය වේ.

17. **නව අනුපුබ්බ විහාර** : ප්‍රථමධ්‍යාන පටන් නිරෝධ සමාපත්තිය දක්වා ඇති සමාපත්ති 9 කි

18. **දස සඤ්ඤා** : අනිච්ච සඤ්ඤා - අනත්ත - අසුභ - ආදිනව - පහාන - විරාග - නිරෝධ - සබ්බලෝකේ අනභිරත - සබ්බ සඞ්ඛාරේසු අනිච්ඡා සඤ්ඤා හා ආනාපාන සති යන 10 කි

19. **දස කසිණ** : පඨවි කසිණ - ආපෝ - තේජෝ - වායෝ - නිල - පීත - ලෝහිත - ඕදාත - ආකාස - හා ආලෝක කසිණ යන 10 කි

20. **ආනාපාන සති** : ආශ්වාස ප්‍රශ්වාස අරමුණු කොට රූපාවචර ධ්‍යාන වඩන කර්මස්ථානයකි.

පටුන

21. **දස අසුභ :** උද්ධුමාතක - විනීලක - විපුබ්බක - විච්ඡිද්දක - වික්ඛායිතක - වික්ඛිත්තක - හතවික්ඛිත්තක - ලෝහිතක - පුලවක හා අට්ඨික යන 10 කි. (22 සිට 28 දක්වා ඇති ධර්ම ඉහත දක්වන ලදහ)

29. **දස බල ඤාණ :** ඨානාඨාන ඤාණය - කම්ම විපාක - සබ්බත්ථ ගාමිණී පටිපදා - අනේකධාතු නානාධාතු ලෝක - නානාධිමුත්තිකතා - ඉන්ද්‍රිය පරෝපරියත්ත - ඣානාදීනං සංකිලේසාදි ඤාණ - පුබ්බේ නිවාස - දිබ්බචක්ඛු හා ආසවක්ඛය ඤාණ යන 10 කි.

30. **චතු විසාරද ඤාණ :** බුද්ධත්වය - ආශ්‍රවක්ෂය - අන්තරායික ධර්ම හා නෛර්‍යාණික ධර්මය ගැන, විසාරද ඤාණ 4 කි.

31. **චතු පටිසම්භිදා :** අර්ථ - ධර්ම - නිරුක්ති - ප්‍රතිභාන පිළිබඳ ඤාණ 4කි.

32. **ෂ අභිඤ්ඤා :** ඍද්ධිවිධ-දිව්‍යශ්‍රෝත - පරචිත්ත විජානන- පූර්වේනිවාස දිව්‍ය චක්ෂු හා ආශ්‍රවක්ෂයකර ඤාණ යන අභිඤ්ඤා 6 යි.

33. **ෂ බුද්ධධම්ම :** අතීත - අනාගත - වර්තමාන - කාලත්‍රයෙහි නොපැකිල පවත්නා වූ ඤාණගති (3) තුන හා ඤාණය පෙරටු කොට පවත්නා වූ, කාය කර්ම-වචීකර්ම-මනෝ කර්ම (3) ද යන, සය බුද්ධ ධර්ම නම් වෙති.

(මහානිද්දෙස පාලි)

**බුද්ධෝ’පි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං**
**කප්පම්පි චේ අඤ්ඤං මහාසමානෝ,**
**ඛීයේථ කප්පෝ චිර දීඝමන්තරේ**
**වණ්ණෝ න ඛීයේථ තථාගතස්සා’ති**

ලොවුතුරා බුදු කෙනෙකු ආයුෂ අවසන් වන තෙක් වෙනත් බණක් දේශනා නොකර බුදුගුණම දේශනා කරන්නේ නම්, තමන් වහන්සේගේ ආයුෂ ගෙවීගියද තථාගත බුදුරජාණන් වහන්සේගේ බුදුගුණ වර්ණනාව නිමකළ නොහැක්කේමය.

පටුන